උත්සාහයෙන් වීර්යයෙන්... ජීවිතය ජයගන්නට වෙර දරනා...

පින්වන්ත දූ පුතුන් උදෙසා...



# හොඳ සවන්දෙන්නෙක් වෙන්න...

- සාමාවතිය හා මාගන්දියාගේ කථා වස්තුව
- ලක්ඛණමිග ජාතකය
- සෙනෙහෙබර ආමන්ත්‍රණය
- නිර්මාණ ඉසව්ව

ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

SCO
SHRADDHA CHARITY ORGANIZATION

www.sco.lk



මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා**
**සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන**
**අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණ මිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දායාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා !

මහමෙව්නාව භාවනා අසපුව
ශ්‍රද්ධා TV
ලක්විරු FM
kids TV
Powered by shraddha media network

**නමෝ බුද්ධාය!**

ව්‍යවහාර වර්ෂ 2023 ක් වූ නොවැම්බර් 01 දින දී ය.

පින්වත් දුවේ පුතේ,

**'ඇසුර'** කියා කියන්නේ අපේ ජීවිතවල බොහොම තීරණාත්මක සාධකයක්. අප ඇසුරු කරන දේවලට අනුව තමයි අපේ ජීවිතවල හැඩතලය නිර්මාණය වෙන්නේ. ඒ නිසා, ජීවිතයේ පදනම සකස් කරන වටිනා වයසක සිටින ඔබ ඔබේ ඇසුර ගැන බොහෝ සෙයින් සැලකිලිමත් විය යුතුයි.

දෙව්මිනිස් ලෝකයාගේ යහපත පිණිස, හිතසුව පිණිස වූ මංගල කාරණා දේශනා කරමින් අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහා මංගල සූත්‍රයේ දී පළමුවෙන් ම වදළේ අසත්පුරුෂ අනුවණ බාලයන් ඇසුරු නොකිරීම ම මංගල කාරණයක් කියලයි. එහි දී සම්බුදුරජාණන් වහන්සේ දෙවනුව වදළේ සත්පුරුෂ නුවණැතියන් ඇසුරු කිරීම ම මංගල කාරණයක් කියලයි. මේ කරුණ ඔබ හොඳින් සිතෙහි දරා ගත යුතුයි.

දුවේ පුතේ, ඔබ කවුරුත් වනාන්තර දැක තිබෙනවා නේ ද...? ඒ වනාන්තරවල වසර සිය ගණනින් කල් ගනිමින් හැදී වැඩුණු දැවැන්ත ගස් තිබෙනවාත් ඔබ දැක ඇති. සාමාන්‍යයෙන්, විශාල ගසක් සෙවණේ යටිරෝපණයක් දකින්නට ලැබෙන්නේ නැහැ. ඒත් දුවේ පුතේ, යම් විදිහකින් එක්තරා වැලක බීජයක් ඔය විශාල ගසක් යට පැළ වුණා කියා සිතමු. ඒ වැල ගසේ එතෙමින් ඉහළට ඇදෙන්නට පටන් ගන්නවා. වසර සිය ගණනක් කල් අරගෙන ඉහළට නැගුණු ඒ ගසේ මුදුන කරා යන්නට අර වැලට මහා කාලයක් ගත වෙන්නේ නැහැ.

බොහොම කෙටි කාලයකින් වැල ඉහළට නැගිලා තුරුහිස වසා ගන්නවා...

සමහර විට, වැල ගස සම්පූර්ණයෙන් ම වසාගැනීමේ හේතුවෙන් ගසේ වැඩීම නතර වෙන්නත් පුළුවන්. ඒ විතරක් නෙමෙයි; ධාරාණිපාත වර්ෂාවක දී ගස ඇද වැටෙන්නට වුණත් අර වැලේ පැතිර යාම හේතුවෙන්නට පුළුවන්...

ඔන්න ඔය විදිහට ම තමයි දුවේ පුතේ, කෙනෙක් වෙහෙස මහන්සි වෙලා උපදවාගෙන රැකගන්නා ගුණධර්මයන් නසා දමන්නට පාපී ඇසුරකට ගත වෙන්නේ බොහොම ටික කාලය යි. ඒ පාපී ඇසුර නිසා ම ඒ කෙනා ගැන අපකීර්තියක් පැතිරෙනවා. ඒ කෙනා ගුණයෙනුත් පිරිහෙනවා. හරියට සඳක් අවපසට හැරුණා වගේ දවසින් දවස, මොහොතින් මොහොත ඒ කෙනාගේ ජීවිතය අඳුරු වෙන්නට පටන් ගන්නවා. ඔන්න ඔය කාරණය නිසා අපේ ඇසුර ගැන අපි ගොඩාක් හොඳින් සිතා බලන්නට ඕනි.

ඔබේ යාළුවන්, ඔබ අන්තර්ජාලයෙන් රූපවාහිනියෙන් ඇසුරු කරන දේ ඔස්සේ ඔබ පාපී ගතිගුණ දුරු කරන, උනන්දුවෙන් ඉගෙනුම් කටයුතුවල යෙදෙන, මාපිය වැඩිහිටි ගුරුවරුනට ගරුසත්කාර දක්වමින් ගුණයෙන් වැඩෙන වටිනාකම් ලබනවා නම්, ඒ වටිනාකම් රැක ගන්නවා නම් සහ වර්ධනය කර ගන්නවා නම් ඔබ දියුණුවට පත් වීම මේ ලෝකයේ කිසිවෙකුටත් වළක්වන්නට බැහැ. එහි අනෙක් පැත්තත් ඒ විදිහමයි. ඔබේ ඇසුර තුළ පාපී ළාමක භාවයන් දිරි ගැන්වෙනවා නම්, ඔබ ව ඉගෙනුම් කටයුතු සම්බන්ධයෙන් උදාසීන කරවනවා නම්, ඔබ ගුණහීනයෙකු කරවනවා නම් ඔබ පිරිහී යාම වළක්වන්නටත් බැහැ.

පින් වැඩෙන විදිහට, පව් රැස් නොවන විදිහට, යහපත සැලසෙන විදිහට, අයහපත වැළකෙන විදිහට, දියුණුව ලැබෙන විදිහට, පිරිහීමක් නො වන විදිහට ඔබේ ඇසුර ගැන තීරණ ගැනීමට ඔබේ හිතසුව කැමති දෙමව්පියන්, ගුරුවරුන්, වැඩිහිටියන් නිරන්තරයෙන් මඟ කියනවා. ඒ ගැන අවවාද අනුශාසනාවන් ද සිදු කරනවා. ඒ තුළ පිහිටා ඇසුරු කළ යුතු අය හා ඇසුරු නොකළ යුතු අය වෙන් කර ගැනීමට ඔබ උත්සාහවත් වෙන්න.

පාපී පුද්ගලයන්ගේ බලපෑමෙන් කඩා නොවැටෙන - විපතට පත් නොවන ජීවිතයක් උපදවා ගන්නට ඔබ කැමති වෙන්න. ඒ වෙනුවෙන්, නුවණැති සත්පුරුෂයන් විසින් පසසනා ගුණැතියන් ම ඔබේ ඇසුරට තෝරාගන්න. ඒ තමයි ජීවිත සාර්ථකත්වයේ පදනම.

උතුම් තෙරුවන් සරණින් ඔබට ද ගුණවත් සිල්වත් නැණවත් පිරිස් ඇසුරේ අභිවෘද්ධියට පත් වීමේ වාසනාව ලැබේවා!

**තෙරුවන් සරණයි!**

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

# පටුන


01. සාමාවතිය හා මාගන්දියාගේ කථා වස්තුව 11

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 26

03. ලක්ඛණමිග ජාතකය 37

04. හොඳ සවන්දෙන්නෙක් වෙන්න 53

05. නිර්මාණ ඉසව්ව 59

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

## (අප්පමාද වර්ගය)

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද
ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



මාගන්දිය බමුණා සහ බැමිණිය තම දියණිය සරසවාගෙන බුදුරජාණන් වහන්සේ වෙත පැමිණෙති.

# සාමාවතිය හා මාගන්දියාගේ කථා වස්තුව

## " නිවන් මගේ කැපවුණු අය නිවන් දකිනවා. ලෙස් ගොඩේ පැටලුණු අය දුකට වැටෙනවා "

පින්වතුනේ, පින්වත් දරුවනේ, සමහරු රූපය නිසා මත් වෙනවා. සමහරු සල්ලි වලින් මත්වෙනවා. තවත් අය උගත්කමින් මත්වෙනවා. තනතුරු වලිනුත් ඇතැම් අය මත්වෙනවා. මත්වෙනවා කියන්නේ හිතට ගන්නවා කියන එකයි. ආඩම්බර වෙනවා, අහංකාර වෙනවා, හිතුවක්කාර වෙනවා. මත්වුණු කෙනෙක් ඒ නිසාම විනාශ වෙනවා.

හැබැයි නුවණැති කෙනා නම් කවරදාකවත් එවැනි මෝඩ වැඩ කරන්නේ නෑ. ඒ කෙනා තමන්ට ලැබෙන හැමදෙයක්ම යහපතට හරවා ගන්නවා. දැන් ඔබ කියවන මේ කතාවත් ඒ වගේ එකක්. යහපත, අයහපත දෙකම ගැන කියවෙනවා. යහපතෙන් සැප ලැබීමත්, අයහපතින් දුක ලැබීමත් උදාකර ගන්නේ තමන් විසින්මයි.

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපේ බුදුරජාණන් වහන්සේ චාරිකාවේ වඩිද්දී කුරු කියන රටට වැඩියා. වැඩම කරලා කම්මාස්සදම්ම නම් කුඩා නගරයේ වාසය කළා. දිනක් බුදුරජාණන් වහන්සේ මහාකරුණා සමාපත්තියට සමවැදී ලෝ සතුන් දෙස බැලුවා. ඒ මහාකරුණා දෙනෙතට අහිංසක අම්ම, තාත්ත දෙදෙනෙකුව පෙනුණා. ඒ තාත්තාගේ නම මාගන්දිය බ්‍රාහ්මණතුමා. අම්මාගේ නම මාගන්දියා බ්‍රාහ්මණතුමිය. බ්‍රාහ්මණ කිච්චේ උසස් කුලයකටයි. ඉතින් මේ දෙදෙනාට චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගැනීමේ වාසනාව

හොඳින් පිහිටලා තිබුණා. අනාගාමී අවස්ථාව දක්වා තමන්ගේ නිවන් මග දියුණු කර ගැනීමේ වාසනාව පිහිටලා තිබුණා. පින්වතුනේ, පින්වත් දරුවනේ, බුදුරජාණන් වහන්සේ අන්න ඒ වාසනාව මේ මව් පිය දෙදෙනා තුළ තියෙනවා දැක්කා.

මාගන්දිය බමුණාත්, බැමිණියත් තමන් එතරම්ම වාසනාවන්ත බව දැනගෙන සිටියේ නැහැ. මේ දෙදෙනා සිතුවේ ලස්සනම ලස්සන රූ සපුවක් තියෙන දියණි කෙනෙකුන් ලබන්නට තරම් වාසනාවන්ත බවයි. ඒ කියන්නේ මේ දෙදෙනාට ලස්සන දියණියක් හිටියා. දුටුවන්ගේ නෙත් සිත් වසඟ වෙනවා. එම දියණිය ඉතාමත්ම සෝභා සම්පන්නයි. මේ ගැන මව්පියන් දෙදෙනාට හරි සතුටුයි. රුව ඇති දුවක් සිටිනවා නම්, ඒ පවුලට වාසනාව කැඳවනවා කියලයි මේ දෙදෙනා කල්පනා කළේ.

මාගන්දිය බමුණා තම රූබර දියණියට ඊටත් වඩා ලස්සන රූ සපුවක් ඇති තරුණයෙකු සොයන්නට මහත් වෙහෙසක් ගත්තා. නමුත් දුවගේ රූපෙට ගැලපෙන හැඩකාරයෙක් ජේන තෙක් මානයකවත් මුණගැසුණේ නැහැ. මාගන්දිය බමුණා හැමතිස්සේම කල්පනා කළේ තමන්ගේ ලස්සන දෝණිට එවැනිම තරුණයෙක් ලැබුණු දවසට ආඩම්බර වෙන්නට පුළුවන් බවයි.

එදා මාගන්දිය බමුණා තමන් ගිනි පුදන තැනට ගියා. හරි පුදුමයි. නුග ගස් සෙවණේ ඉතාමත් ලස්සන රූප ශෝභාවයෙන් යුතු තරුණ ශ්‍රමණයන් වහන්සේ නමක් භාවනා කරමින් සිටිනවා.

'මොනවා.... කවුද මේ....? හැබෑ ම ලස්සනයි. මෙච්චර කාලෙකට මෙවැනි කඩවසම් තරුණයෙක් මං දැකල නෑ.

රන්වන් පාටයි. දිලිසෙනවා. උස මහත කදිමට ගැලපෙනවා. මෙවැනි රූප ශෝභාවයක් ඇති කෙනෙක් අපේ දූට විවාහ කර දෙන්නට ඇත්නම් මොන තරම් අගේද?'

මාගන්දිය බමුණා ඒ දුටුවේ බුදුරජාණන් වහන්සේවයි. ඉතින් ඔහු බුදුරජාණන් වහන්සේ දෙස ඇස පිය නොහෙලා බලා සිටියා. ඔහුට හරිම සතුටුයි. තමන්ගේ දියණියට ගැලපෙන සහකරුවා දිව්‍ය ලෝකයෙන් ඇවිල්ලා වගෙයි.

මාගන්දිය බමුණා පුදුමයෙන් පියවර කීපයක් ආපස්සට ගියා. නැවත හැරී බල බලා කෙලින්ම ගෙදර ගියා. ඔහුට හරිම හදිස්සියි. ඔහු මාගන්දියා බැමිණිය සොයා ගෙන ගියා. ඔහු කඩිමුඩියේ වේගයෙන් කතා කළා.

"හාමිනේ.... හාමිනේ..... හරි..... හරි.... හරියටම හරි.... මම හිතපු දේ හරිගියා..... අවුරුදු ගණනක් බලා ගෙන සිටපු සුදුස්සා මට හම්බ වුනා. හාමිනේ.... වැඩිය කතා කරන්න වෙලාව නෑ. දිව්‍ය ලෝකයෙන් බිමට බැහැලා වගෙයි. ලස්සන කඩා හැලෙන තරුණයෙක් මට මුණගැහුණා. ඒ තරුණයා පිටත් වෙන්න කලින් අපි යන්න ඕන. හාමිනේ.... ඉක්මන් කරන්න ඕන. කෝ දුව..? මාගන්දියා... දුවේ..., අපි හරි වාසනාවන්තයි. ඔයාට ගැලපෙන තරුණයෙක් මට මුණගැහුණා. ඇත්තෙන්ම ඔයාගේ රූපයවත් ඒ තරම් ලස්සන නෑ. දෙව් ලොවින් ඇවිල්ලා වගෙයි. එතරම් ලස්සන කෙනෙක් කැමති වෙන්නෙ ලස්සන දේකටමයි. ඒ නිසා දුවේ..., දැන් ඉක්මන් කරලා ලස්සනට සැරසෙන්න. වැඩිය කල් වේලා නෑ. ඉක්මනින්ම යන්න ඕන."

ඉතින් අම්ම, තාත්ත දෙන්න තම දියණිය වන මාගන්දියාව ලස්සනට සරසවාගෙන පිටත් වුණා. මාගන්දියා ලස්සන ආභරණ පැළඳ සිටියා. ඇස්වල අඳුන් ගාලා තිබුනා. යටි පතුල් රෝස පාට කළා. අත්වලට ලස්සන වළලු දැම්මා.

පාවල මිණි නූපුර දැම්මා. ලස්සනට පීරපු කේශ කලාපය මලින් සැරසුවා. සළු පටෙන් මුහුණ වසාගෙන පිටත් වුනා. තුන් දෙනාම නුග රුක සෙවණට ගියා. කවුරුවත් නෑ.

"කෝ.... මෙතන හිටපු කෙනා?"

මාගන්දිය බමුණා වට පිට බැලුවා. කවුරුවත් පෙනෙන්න නෑ. මාගන්දියා බැමිණිය බිම පිරික්සා බැලුවා.

"මේ... මේ.... මෙහෙ එන්න. මෙන්න සලකුණක් තියෙනවා.... ඔය තියෙන්නෙ පාදයක සටහන. හප්පේ.... මේ යටි පතුලේ සටහනින් පෙන්නුම් කරන්නේ අපි හිතන දේ නොවෙයි. මේ කෙනා කාම ලෝකෙට අයිති කෙනෙක් නෙවෙයි. මේ කෙනා ඍෂිවරයෙක් වෙන්න ඇති. එහෙම කෙනෙකුට තමයි මෙවැනි පා සටහන් තියෙන්නෙ."

"අනේ හාමිනේ..., ඔන්න... ඔන්න.... බොරුවට දොඩවන්න පටන් ගත්තා. හොඳ දෙයක්, මංගල කටයුත්තක් කෙරෙන වෙලාවෙ මූසල කතා කියන්න පටන් ගත්තා. හාමිනේ..., ඒ තරුණයා අපේ දුව දුටු ගමන් වෙනස් වෙන බවට මට විශ්වාසයි. ඒ නිසා අපි දැන් කොහොම හරි එයාව සොයා ගන්නට ඕන."

"අන්න අර.... අර ඉන්නෙ. අර ගහ යට ඉන්නෙ.... ආං.... අරය ගැන තමයි මා කිව්වෙ. යමු... යමු... හනික යමු."

ඉතින් මේ තුන්දෙනා වීතරාගී වූ බුදුරජාණන් වහන්සේ ළඟට පැමිණුනා. බලාපොරොත්තු කන්දක් හිතේ පිරිලා තිබුනා. මාගන්දිය බමුණා බුදුරජාණන් වහන්සේ ඉදිරියට තම දියණිය කැඳවාගෙන ගියා. මාගන්දියා තරුණිය මුහුණ වසා සිටි සළුපට මෑත් කරලා බුදුරජාණන් වහන්සේ දෙස ඇස් කොණින් බලා සිටියා.

"පින්වත් තරුණය, මේ ඉන්නෙ මගේ දියණිය. මැයට තමයි අපි සෑම දෙයක්ම හරි හම්බ කළේ. මැයගෙ රූපෙට සමාන රූපයක් ඇති කෙනෙක් මේ කුරු ජනපදයේම නෑ. රන් රුවක් මැය ඉදිරියෙන් තිබ්බොත් ඒ රූපයේ ආනුභාවය නැතිව යනවා. මැය පතාගෙන රජවරු පවා පැමිණුනා. නමුත් තරුණය, මැය දෙන්නේ ලොව සිටින වඩාත් සුරූපී පුද්ගලයාටයි. පින්වත් තරුණය, ඔබ දිනුම්. ඔබ තමයි මැයගේ හිමිකරුවා. ඔබ තමයි මැයට එකම සුදුස්සා. මැයට ගැලපෙන්නේ ඔබගේ රූපයයි. පින්වත් තරුණය, ඒ නිසා අපි දැන් ගෙදර පිටත් වෙමු" කියලා මාගන්දිය බමුණා දිගින් දිගට ම බුදුරජාණන් වහන්සේට බල කරන්න පටන් ගත්තා. බුදුරජාණන් වහන්සේ දෙස බලා සිටි මාගන්දියා සැනසුම් සුසුම් හෙළුවා. මෙතරම් ලස්සන කෙනෙක් මගේ ස්වාමියා වෙනවා නම්, මේ මහ පොළොවේ සිටින වාසනාවන්ත ම තැනැත්තිය මා නොවේද කියා සිතුවා.

බුදුරජාණන් වහන්සේ මාගන්දියා දෙස බැලුවෙ වත් නැහැ. නමුත් මාගන්දිය බමුණා දෙස මහත් ආදරයෙන් බැලුවා.

"පින්වත් බ්‍රාහ්මණය, මා මේ සිත ජයගන්නට, සිතේ තිබූ කෙලෙස් නැති කරන්නට මහත් සටනක් කළා. මේ සිත පිරිසිදු කරන්නට මා උත්සාහ ගනිද්දී මම මහා සටනක් කළා. ලෝකයේ ඇස් හමුවට එන විවිධාකාර රූප විසින් මනුෂ්‍යයාගේ සිත ඇදගන්නවා, මුලා කරනවා, රවටනවා. තොණ්ඩුවකට හසුවුණ මුවෙක් වගේ ඔහු අසරණ වෙනවා. මාව රාග තොණ්ඩුවට හසුකරගන්නට තුන් දෙනෙක් අප්‍රමාණ මහන්සියක් ගත්තා. තණ්හා, රතී, රගා කියන මාර දූවරු තිදෙනා මේ සිත රාගයෙන් මුසපත් කරවන්නට අප්‍රමාණ මහන්සියක් ගත්තා. වෙන කෙනෙකුගේ නම් සිහිය විකල් වෙනවා. නමුත් බ්‍රාහ්මණය, මොහොතකට වත් මගේ සිත වෙනස් කරන්නට ඔවුන්ට බැරි වුණා. එබඳු මායාකාරී අමනුෂ්‍ය ස්ත්‍රී රූපයටත් වසඟ කළ

නොහැකි වූ මාගේ සිත දැන් වසඟ කරන්නෙ කොහොමද? මේ ශරීරය ලස්සනට තිබුනට, අසූචි පුරවපු කළයක් වගෙයි. ආභරණ පළන්දලා, සළු පිළි වලින් සරසලා මල් ගවසලා ඒ අසූචි කළය සරසනවා. නමුත්, අසූචි වලින් හමන දුර්ගන්ධය නැතිව යන්නෙ නෑ. ඔය ශරීරයත් ඒ වගේ. දොරටු නවයකින් අසූචි වැගිරෙනවා. පින්වත් බ්‍රාහ්මණය, ඒ නිසා මෙවැනි ශරීරයක් මා අතින් තබා පයින්වත් ස්පර්ශ කරන්නට කැමැති නෑ."

මාගන්දිය බමුණාටත්, බැමිණියටත් හරිම පුදුමයි. මෙතුමාගේ රූපය විතරක් නෙවෙයි ලස්සන, හිතත් ලස්සනයි. නුවණින් බබලනවා. බුදුරජාණන් වහන්සේ රූපයේ නිසරු බව ගැන විස්තර කරද්දී, උන්වහන්සේගේ අභිනීල නෙත් යුග තව තවත් දිළිසුණා. ඒ හැම වචනයක්ම හරිම පැහැදිලියි. හරිම නිරවුල්. අවබෝධය ඇතිකරවනවා. මේ දෙදෙනා ඒ විස්තරයට කැමති වුණා. බුදුරජාණන් වහන්සේගේ අවබෝධය හරි බව මේ දෙදෙනාට වැටහුණා. දෙදෙනාම බුදුරජාණන් වහන්සේව සරණ ගියා. ඒ දෙදෙනාට ම චතුරාර්ය සත්‍ය ධර්මය ගැඹුරින් අවබෝධ වුණා.

බුදුරජාණන් වහන්සේ රූපය ගැන ඇත්ත කතා කරගෙන යන විට මාගන්දියාගේ ඇස් රතු වුණා. සළු පටින් මුහුණ වසා ගත්තා. ගස්සලා හිස හරවා ගත්තා. අමාරුවෙන් අසාගෙන හිටියා. ඇස් වලින් කඳුළු ගලන්න පටන් ගත්තා. ක්‍රෝධයෙන් ශරීරය වෙව්ලන්න පටන් ගත්තා. තරහෙන් හදවත ගැහෙන්න පටන් ගත්තා. ඇය හිතුවේ ඇයට අපහාස කළා කියලයි. ඇය ආපසු හැරුණා. වේගයෙන් ගෙදර ගියා. ඇඳේ වැතිරුණා. දත් මිටි කෑවා. අත් දෙක මිට මොලවාගෙන කොට්ටෙට ගහගෙන ගියා.

'ඔව්... මගේ රූපය කැතයි එහෙනම්. ඔව්.... මගේ රූපය අසූචි කලයක් නේද....? ඔව්...., මගේ රූපයේ හැටි මං පෙන්නන්නම්. මේ අසූචි කළය මොනතරම් බලසම්පන්නද කියල මං පෙන්නන්නම්.... මේ අසූචි කළයට හැමෝම වසඟ වෙන හැටි මම පෙන්නන්නම්.... අයියෝ....! මගේ ලස්සන කොණ්ඩෙ.... මගේ මේ ලස්සන ඇස් දෙක.... මගේ ලස්සන තොල් සඟල.... රත්තරන් පාට කම්මුල්.... මේ ලස්සන ඇඟිලි.... මගේ ලස්සන අත්.... මේ ලස්සන දත්.... ඔව්..., මේ සෑම දෙයක්ම දැක්කෙ කැටයම් කරපු අසූචි කළයක් වගේ නේද? හරි... මං දන්නවා කරන දේ....'

පින්වතුනේ, පින්වත් දරුවනේ, මාගන්දියා තරුණිය බුදුරජාණන් වහන්සේ කෙරෙහි වෛර බැඳගත්තා. ක්‍රෝධ කළා. ඊර්ෂ්‍යාවෙන් ගිගිරුවා. සිත ඇතුළේ පළිගැනීමේ ආශාව අළු යට ගිනි පුපුරු වගේ තැන්පත්ව තියා ගත්තා. අන්තිමේදී ඇයගේ පවිටු අදහස ඉටුකරගැනීමේ අවස්ථාව උදාවෙන්න පටන් ගත්තා. ඇය කොසඹෑ නුවර උදේනි රජතුමාගේ අග්‍ර මහේෂිකාව බවට පත්වුණා. දැන් ඇය සියලු ආභරණ වලින් සැරසිලා උදේනි රජු සමඟ සම අසුන්ගෙන වාඩිවෙලා මහත් ආනුභාවයෙන් ඉන්නවා. රාජකීය ලීලාවෙන් වැජඹෙනවා. ඇස් කඩා හැලෙන ලස්සන රූපයක් තිබෙන මාගන්දියාගේ හදවතේ කුණු වූ මසක් මෙන් දුර්ගන්ධය පිරී තිබුණා. ඇය මිනිසුන්ට අල්ලස් දී බුදුරජාණන් වහන්සේට නොයෙක් ආකාරයෙන් නින්දා කෙරෙව්වා. අපහාස කෙරෙව්වා. මිනිස්සුන්ව බුදුරජාණන් වහන්සේට විරුද්ධව කෙටෙව්වා.

මාගන්දියාගේ පළිගැනීම සෑහීමකට පත්වුණේ නෑ. ඇය පළිගැනීමෙන්මයි සතුටු වෙන්නෙ. ඇයගේ පළිගැනීමේ අවසානයක් නෑ. ඇයට මාළිගාව ඇතුළේ කිසිම සැනසිල්ලක් තිබුණෙ නෑ. ඒකට හේතුවක් තිබුණා.

උදේනි රජතුමාට සාමාවතී කියල ඉතා යහපත් බිසවක් හිටියා. ඇයත් ලස්සනයි. ඒ වගේ ම ඉතාමත් ගුණ සම්පන්නයි. ඇයට මල් ගෙනෙන ඛුජ්ජුත්තරා නම් සේවිකාවට දිනක් බුදුරජාණන් වහන්සේව මුණ ගැසුණා. උන්වහන්සේගෙන් බණ ඇසුවා. සෝවාන් වුණා. එදා සිට සාමාවතී ඇතුළු පරිවාර ස්ත්‍රීන් පන්සීයකට ඛුජ්ජුත්තරාව ගෙන් බණ අසන්නට ලැබුණා.

ඉස්සර ඛුජ්ජුත්තරා මල් ගෙනෙන්ට දෙන මුදලින් අඩක් ම සොරකම් කරනවා. ඉස්සර ඇය සෙරක්. සෝවාන් වූ දවසේ සිට ඇය උතුම් ආර්ය ශ්‍රාවිකාවක් වුණා. එදා සිට තුනුරුවන් කෙරෙහි නොසෙල්වෙන පැහැදීමත් ආර්යකාන්ත ශීලයත් ඇය තුළ පිහිටා තිබුණා. සාමාවතියට ඇය ඇත්ත කිව්වා. තම දාසියගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් කළ ඒ උතුම් ධර්මය ඇසීමේ වුවමනාව සාමාවතියට ඇති වුණා. ඛුජ්ජුත්තරා ධර්මය අසනවා. අසන්නා වූ ධර්මය ඇය හොඳින් මතක තබා ගන්නවා. ඒ මතක තබාගත් ධර්මය නුවණින් මෙනෙහි කරනවා. ඒ නුවණින් මෙනෙහි කරන ධර්මය ඇසූ අයුරින්ම සාමාවතියටත්, පරිවාර ස්ත්‍රීන්ටත් කියා දෙනවා. ඛුජ්ජුත්තරා මතක තබා ගත් ධර්මය 'ඉතිවුත්තක පාළි' නමින් අදටත් අපට කියවන්නට ලැබෙනවා.

මාගන්දියා බුදුරජාණන් වහන්සේට කොතරම් වෛර කළාද යත්, බුදු ගුණ සිහිකරන අයටත් වෛර කළා. ධර්මයේ හැසිරෙන අයටත් වෛර කළා. මේ පව්ටු ස්ත්‍රියගේ වෛරයට අහිංසක සාමාවතී ප්‍රධාන පරිවාර ස්ත්‍රීන් ලක්වුණා. ඇය ඉතා ම දරුණු උපාය යෙදෙව්වා. දිනක් සාමාවතිය ඇතුළු සියලු ස්ත්‍රීන් සිටි ගොඩනැගිල්ලේ සියලු දොරවල්වල අගුලු සිර කළා. තෙල් පෙගවූ රෙදි වලින් ඒ ගොඩනැගිල්ල වටේ එතුවා. ගිනි තිබ්බා.

සාමාවතිය කලබල වුණේ නෑ. ඇය සියලු පරිවාර ස්ත්‍රීන් අමතන්න පටන් ගත්තා.

"පින්වත් නැගණිවරුනි, ඉපදීම නිසා මූණ දෙන්නට සිදුවන මරණයටයි දැන් අපි මූණ දෙන්නේ. කිසි කෙනෙක් මේ වටේ ඇවිලෙමින් එන ගිනි දැල්වලට භය වෙන්න එපා. මෙයට වඩා දරුණු ගිනි දැල් වලින් පව් කළ උදවිය අපායෙහි වෙළෙනවා. මේ ගිනි දැල් වලින් පිච්චෙන්නේ මේ කුණු ශරීරය විතරයි. එක්කෙනෙක්වත් ද්වේෂ ගින්න, ක්‍රෝධ ගින්න, වෛර ගින්න මේ සිත තුළ අවුලුවා ගන්න එපා. මේ සිත නිවන ධර්මය අපට මුණ ගැසුණා. අපි බුදුරජාණන් වහන්සේගේ දියණිවරු. ඒ නිසා ශාස්තෘන් වහන්සේගේ ගමන් මාර්ගයේ අපි ගමන් කරමු."

සාමාවතියගේ ධර්ම කථාව සියලු දෙනාගේ ම හදවත් සිසිල් කරන අමා දිය දහරක් වුණා. ඔවුන් සියලු දෙනාගේ ම ශරීර ගින්නෙන් දැවුණා. මරණයට පත්වුණා. නිදා පිබිදියා සේ ඔවුන් දෙවියන්, බඹුන් අතර උපන්නා.

මාගන්දියා අග්‍ර මහේෂිකාව විසින් කරන ලද මෙම අමානුෂික අපරාධය ගැන උදේනි රජු බලවත් ලෙස උදහස් වුණා. අහිංසක ජීවිත හිතාමතා කුමන්ත්‍රණය කොට විනාශ කිරීම ගැන හොඳට ම උදහස් වුණා. උදේනි රජතුමා මාගන්දියාටත්, අපරාධයට හවුල් වූ සැමටත් දරුණු දඬුවම් දුන්නා. මාගන්දියා මරණයට පත්වුණා. නිරයේ උපන්නා. මාගන්දියාගේ වචනයට රැවටී නොමඟ ගොස් ඒ අපරාධවලට හවුල් වූ සියලු දෙනාත් මරණින් මතු නිරයේ උපන්නා.

මේ සිදුවීම මුල් කොට ගෙන භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගාථා තුනක් වදාළා.

**21.1. අප්පමාදො අමත පදං - පමාදො මච්චුනෝ පදං**
**අප්පමත්තා න මීයන්ති - යේ පමත්තා යථා මතා**

බාහිර වැඩවල නොයෙදී
- නිවන් මගට කැප වෙයි නම්,
නොපමාවෙන් වසන කෙනා
- ලබයි නිවන සැප සදනා
බාහිර වැඩවල යෙදෙමින්
- දහමින් බැහැරට යයි නම්,
පමාවෙන්ම වසන කෙනා
- මැරී මැරී යයි සසරෙම
නිවන් මගට කැප වෙන අය
- ලබයි අමරණීය නිවන
කෙලෙස් ගොඩේ සිටිනා අය
- සිටියත් මළ කඳන් වැනිය

**22.2. ඒතං විසේසතෝ ඤත්වා - අප්පමාදම්හි පණ්ඩිතා**
**අප්පමාදේ පමෝදන්ති - අරියානං ගෝචරේ රතා**

කැපවීමෙන් ලබයි නිවන
- කෙලෙස් වලින් යයි සසරේ
මේ දෙක ගැන දන්න කෙනා
- මැනැවින් නුවණින් විමසා
නුවණැතියෙක් ලෙස මෙලොවේ
- කැපවෙයි ඒ නිවන් මගේ
ආර්ය උතුමන් තුළ ඇති
- නොපමා බවටම ඇලෙමින්
නිවන් මගට කැපවීමෙන්
- ලබයි දහම තුළින් සතුට

**23.3. තේ ඣායිනෝ සාතතිකා - නිච්චං දළ්හපරක්කමා
ඵුසන්ති ධීරා නිබ්බාණං - යෝගක්ඛේමං අනුත්තරං**

ඔවුන් දැහැන් වඩයි නිතර
- නිවන් මගෙහි යෙදෙයි නිතර
දැඩි වූ වීරියෙන් යුතුව
- සිල් සමාධි නුවණ ඇතිව
සියලු කෙලෙස් වලින් මිදුන
- උතුම් අමා සුවය රැඳුන
නිවනම ලැබ ගනිති ඔවුන්
- මහ නුවණින් යුතුය ඔවුන්


පින්වතුනේ, පින්වත් දරුවනේ, මෙම ගාථාවන් තුළින් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා වදාළේ අප්‍රමාදයේ වටිනාකම ගැනත්, ප්‍රමාදයෙහි භයානකකමත්ය. අප්‍රමාදය කියන්නෙ තමන්ගේ ජීවිතය මුළුමනින්ම ධර්මයට කැප කිරීමටයි. ඒ කියන්නේ තමන් ඉතා සිහියෙන් යුතුව ඉන්නවා. නුවණින් විමසනවා. කයින් සිදුවෙන අකුසල් දුරුකරනවා. වචනයෙනුත් අකුසල් කරන්නෙ නෑ. සිත ගැන කල්පනාවෙන් ඉන්නවා. සිතෙන් අකුසල් සිදුවෙන්නට ඉඩ තියන්නෙ නෑ. වියලුන තණ කොළ ගොඩකට ගිනි පුපුරක් වැටුණොත් ඉක්මනින් ඇවිලෙනවා. අසංවර හිතත් ඒ වගේ. අකුසල් හටගත්තු ගමන් ඒ අකුසල්වලට යට වෙනවා. නමුත් තණ කොළ ගොඩට ගිනි පුපුර වැටුණ ගමන් අතින් පයින් ගසා වහා කලබලයෙන් නිවා දමනවා වගේ අප්‍රමාදී කෙනා තමා තුළ අකුසල් හටගත් සැණින්, දුරුකරනවා. අකුසල්වලට බිය වෙනවා. ඒ කෙනා තමයි ජීවිතය ජයගන්නෙ. ඒ කෙනා තමයි යළි යළි ඉපදෙන මැරෙන සසරෙන් එතෙර වන්නෙ. ඒ කෙනා තමයි නිවන් අවබෝධ කරන්නෙ.

ප්‍රමාදය ඊට හාත්පසින්ම වෙනස් එකක්. ප්‍රමාද වුන කෙනා හැම තිස්සේම කල්පනා කරන්නෙ තමන්ගෙ ශරීරය ගැන, හැඩරුව ගැන, මිල මුදල් ගැන, වතුපිටි ගැන, ඉඩකඩම් ගැන, හරකබාන ගැන, යාන වාහන ගැන, අඹු දරුවන් ගැන ආදියයි. ඒ වෙනුවෙන්ම මුළු ජීවිතයම කැප කරනවා. යම්කිසි කෙනෙක් නිවන් අවබෝධ කරන්නට කැමැත්තෙන් ධර්මයේ හැසිරෙනවා නම්, එයාටත් හිනහා වෙනවා. අපට දැන්මම නිවන් දකින්නට ඕන නැතැයි නිවනටත් ගරහනවා. ධර්මයටත් ගරහනවා. ජීවිතය වටින්නෙ ආයෙ ආයෙමත් ඉපදෙන කොට කියලයි ඒ ප්‍රමාදී පුද්ගලයා දකින්නෙ. ඒ නිසා ඔහු පරලොවට බයත් නෑ, මෙලොව පව් කරන්න බයකුත් නෑ. බුදුරජාණන් වහන්සේ වදාළේ ඒ ආකාරයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමට කිසිදු උත්සාහයක් නොදරන ජීවිතයක් ගෙවන ප්‍රමාදී පුද්ගලයාගේ පැවැත්ම නැවත නැවත ඉපදෙන මැරෙන සසරටම හේතුව වෙනවා කියලයි. එබඳු කෙනෙක් කොපමණ කාලයක් ජීවත් වුණත්, ඒ පුද්ගලයන්ගේත් නිරන්තරයෙන් ඕජා වැගිරෙන, ගඳ ගසන, මළ මිනියේත් වෙනසක් නෑ කියලයි වදාළේ. අමු සොහොනේ දැමූ මළ මිනියට එකතු වෙන්නෙ අපිරිසිදු සත්තු විතරයි. ප්‍රමාදී පුද්ගලයාගේ ජීවිතයටත් මළ කුණ වටා එන අපවිත්‍ර සතුන් මෙන් ප්‍රමාදී පුද්ගලයන් එකතු වෙනවා. මළ කුණෙන් කුණු ගඳ ගසනවා වගේ ඒ ප්‍රමාදී පුද්ගලයා කයෙන්, වචනයෙන්, මනසින් දුර්ගන්ධය ඇතිවෙන පව් රැස් කරනවා.

නුවණැත්තා මේ වෙනස හොඳින් දකිනවා. අප්‍රමාදී පුද්ගලයා මහත් කැපවීමෙන් යුතුව චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගන්නා ආකාරය හොඳින් දකිනවා. ප්‍රමාදීව පව් රැස් කරගන්නා පුද්ගලයා ඒ හේතුවෙන් හැඬූ කඳුලින් යුතුව මරණයට පත්වී අසාර්ථක වන ආකාරයත්, හොඳින් දකිනවා. මේ නිසාම නුවණැත්තා ප්‍රමාදයට බයයි. එම නිසා අප්‍රමාදය තුළ ම ඉන්නයි මහන්සි ගන්නෙ. ධර්මයටම කැප වෙනවා.

චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කළ යමෙක් ඇද්ද නිවන් අවබෝධ කළ යමෙක් ඇද්ද, ඒ සියලු දෙනාම ආර්ය ගුණ ධර්මවලට පැමිණුනේ කැපවීම නම් වූ අප්‍රමාදය නිසාමයි. එම නිසා නුවණැති කෙනා ඒ අප්‍රමාදයට ම ඇලෙනවා. ඒ කැපවීමට ම ඇලෙනවා. එයා සතුටු වන්නේ නිවන් මගේ කැපවීමෙන් විතරයි.

එබඳු නුවණැති අය නිතරම භාවනා කරනවා. සිතේ අකුසල් හටගැනීමට ඉඩ තියන්නෙ නෑ. සමාධිය දියුණු කරනවා. ධ්‍යාන වඩනවා. හරිම උත්සාහවන්තයි. වීරියවන්වතයි. එබඳු මහත් වීරියකින් යුතු ඥාණවන්තයන් කෙලෙස් බන්ධන වලින් නිදහස් වෙනවා. අනුත්තර වූ අමා නිවන අවබෝධ කරනවා. සැනසීම ලබනවා. අපටත් මේ ගෞතම බුදු සසුනේ චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමට කැපවෙන්න ඇත්නම් මොන තරම් වාසනාවක් ද !



සෙනෙහෙබර

# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කර ගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ සටහන්...

**නමෝ බුද්ධාය!**

**දයාබර දියණිය නිසංසලා වෙත,**

දුවේ ශ්‍රද්ධා මාධ්‍ය ජාලය හරහා දුව මීට පෙර මා වෙත එවූ ලිපි සියල්ලම ලැබුනා. නමුත්, දුවේ මා තරමක කාර්යය බහුල කෙනෙක්. ඒ නිසාම මට දුවට ලිපියක් ලියන්නට අවස්ථාවක් හදා ගන්නට බැරි උනා. දුව ඒ ගැන දුක් වෙන්නට එපා. මුලින්ම දුව සුවෙන් සිටිනවා කියා මා සිතනවා. ඒ වගේම දුවගේ අධ්‍යාපන කටයුතු සාර්ථක වෙන්නටත්, අනාගත බලාපොරොත්තු සාර්ථක වෙන්නටත් කියා මා ආශිර්වාද කරනවා.

ආදරණීය දුවේ, මම දැන් අවුරුදු 60 ක් ඉක්මවූ මවක්. ලිපි ලිවීමට මට කාලය නොමැති වුවත් ඔයා ඉදිරියේදී අධ්‍යාපන ජීවිතයේ එක්තරා අභියෝගයකට මුහුණ දෙන්න සූදානම් වන නිසාත් එයට ආශිර්වාද කරමින් දුවට ලිපියකින් අමතන්නට මට අවශ්‍ය උනා. ඒ නිසායි මේ ලිපිය මම දුවට ලියන්නේ.

දුවේ නිසංසලා, ඔයා එවපු 2022 10 වසර ප්‍රගති වාර්තාව මම බැලුවා. දුව තවත් හොඳට අධ්‍යාපන කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් උත්සාහවත් වෙන්න.

ඒ සඳහා අනවශ්‍ය දේ අත්හැරලා අත්‍යාවශ්‍ය දේ ගැන පමණක් හොඳින් සිතා කටයුතු කරන්න. ඔයාට විභාගය සඳහා කාලය මදි යැයි සිතන්නට එපා. කොරෝනා වසංගතයෙන් පසු මුළු ලෝකයටම අර්බුදකාරී වාතාවරණයක් ඇති උනා තමයි. නමුත් අපි පමණක් ඒ ගැන සිත සිතා කාලය මදි අපහසුතා ආව කියා පසුතැවිලි උනොත් පරාජය අපිටමයි. ඒ නිසා දුවේ අධිෂ්ඨානයෙන් යුතුව ඉලක්කය ජය ගන්නවා කියා සිතන්න. ගුරුවරුන්ගේ දෙමාපියන්ගේ අවවාද වලට අනුව හොඳින් අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන යන්න. 11 වන ශ්‍රේණියේ අධ්‍යාපන කටයුතු වලට කාලය මදි උනා කියලා පසුතැවෙන්නට එපා. ගුරුවරුන් ඉගැන්වූ සියලු විෂයන් හොඳින් මතක තබාගෙන බය නොවී විභාගයට සූදානම් වන්න.

දුව ඔයා මහමෙව්නාව අසපුවට සම්බන්ධ වී ධර්මයේ හැසිරෙනවා ඇති කියලා මා සිතනවා. එය ඔයා එවන ලිපි වලින් මා දැනගත්තා. කුමන අවස්ථාවකදී උනත් හදවතට වඩා බුද්ධියට මුල් තැන දෙන්න. ප්‍රශ්න හමුවේ යහළුවන්ට වඩා වැඩිහිටි දෙමව්පියන්ගෙන් අවවාද ලබා ගන්න.

දුව ඔබ පළමු වරට ලිපියකින් ඇමතූ නිසා ලිපිය ගොඩක් දිග උනා. දැන් මම නවතින්නම්. නැවත ලිපියකින් හමුවෙමු. තාත්තාත් මමත් සුවෙන් ඉන්නවා. දුවටත් දෙමාපිය සහෝදරයන්ටත් නිවසේ සියලු දෙනාටත් නිදුක් නිරෝගී සුවපත් ජීවිතයක් ලැබේවා. ඔයාගේ අනාගතය වාසනාවන්ත වේවා. කියා මම මුලු හදවතින්ම ආශිර්වාද කරනවා. තිසරණ සරණින් දෙව් රැකවරණින් යහපතක් ම වේවා!

**තෙරුවන් සරණයි!**

**මෙයට කැපකරු අම්මා**

## නමෝ බුද්ධාය!

**ආදරණීය දෝණී වෙත,**

ඔබ සහ පවුලේ සැමගේ සැප දුක් කොහොමද ..සුවෙන් ඇතැයි සිතනවා. ඔබ එවූ ලිපි මට ලැබුනා. ලිපි කියවා සතුටු වූ මම සතුටු සිතින්ම ඒ වෙනුවෙන් තුති පුද කරනවා.

මගේ හොඳම මිතුරියකගේ මාර්ගයෙන් තමා මෙම කාර්යයට මා යොමුවූයේ. ඒ ගැන මම ඉතාම සතුටින් නිතර සිහි කරන අතර ඔබගෙන් ලද ලපි වලින් මගේ සිත සැනසුනු බවද ලියන්නේ සතුටින්. ඔබ වැනි දරුවෙකුගේ අධ්‍යාපනයට දශමයක තරමින් වත් උදව් කිරීමට ලැබීම මගේ පෙර පිනක් බව මගේ විශ්වාසයයි. දියණියේ අධ්‍යාපනය කියන්නේ රටට වැඩදායක තම පවුලට වැඩදායක පිරිපුන් මිනිසෙකු ලොවට දායාද කරන ප්‍රධානතම එක් මාර්ගයක් ලෙස මා සිතන්නේ මගේ ජීවිත අත්දැකීම් තුළින්ම යි. ඉතින් ආදර දියණියේ මගේ පැතුම ඔබත් අපේ මේ පුංචි රටේ මැණිකක් වනු දැකීමයි.

මගේ ජීවිතය ගැන යමක් පවසන්න මට සිතුනා. දෙමාපියන් සමග අප පවුල 11ක්. අපේ පවුලේ එකම ආදායම පියාගේ රැකියාව පමණයි. අපේ දුප්පත් පවුලේ 6වන දියණිය මම.

මා දිනපතා පාසැලට යන විට ලස්සන ඇඳුම් අඳින, ලස්සන සෙරෙප්පු පළඳින ලස්සන බෑග් අරගෙන රැකියාවට යන අක්කලා දෙදෙනෙක් දකිනවා. ඒ දසුන දිහා මා හැමදාම බලාගෙන හිටියේ පුදුම ආශාවකින්. මටත් ඒ වගේ රැකියාවකට දිනපතා යන්න ඕනි කියා මගේ සිත මට නිතරම කිව්වා. ඊට

අවශ්‍ය ප්‍රධානම දේ උනේ සාර්ථකව අධ්‍යාපනය හදාරා විභාග සමත් වීම. ඒ වෙනුවෙන් මා කැපවුනා. හැමදාම හවසට මල් පූජා කර බුදුන් වැඳීම මගේ පියාගේ අණක්. එය අප ඉටු කළා. අවසන මගේ ඉලක්කය ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටියා.

කාලය ගෙවිල ගියා. මට හෙදියක් ලෙස රජයේ රැකියාවක් ලැබුනා. මුල් පත්වීම මගේම උපන් නගරයට. සතුටුයි. ඒ සතුටින් කැපවීමෙන් රැකියාවේ නිරත වූ මට රෝහල තුළ හෙදියකට ලැබිය හැකි ඉහළ ම තනතුර වූ හෙදි පාලිකාවක් වන තුරුම උසස්වීම් ලැබුවා. නර්ස් කෙනෙක් ලෙස පත්වූ මම මේට්‍රන් කෙනෙකු ලෙස වසර 37කට පසු විශ්‍රාම ගත්තා. මගේ කැපවීම, උනන්දුව ඒ ජයග්‍රහණ වලට මූලික අත්තිවාරම බව මම විශ්වාස කරනවා.

කොහොම උනත් ජීවිතය ප්‍රශ්න පත්‍රයක්. නිවැරදි ලෙස ජීවිතය හසුරුවාගැනීමේදී පැමිණි බාධක, දුක් කරදර අපමණයි. ඒත් කෙසේ හෝ ඒවාට මුහුණ දුන්නා. ඉතින් දුවේ අද මම ආච්චි අම්මා කෙනෙක්, දියණියන් දෙදෙනෙකුගේ මවක්, එක් දියණියක් විදේශයක. මගේ අම්මා රැකබලා ගන්නේ ළඟ තබාගෙන මමයි.

දුවේ, මට දැන් ඔබත් මගේ ම දියණියක්. මගේ දියණියන් දෙදෙනා ම උපාධිධාරීන්. මගේ තෙවැනි දියණිය වූ නුදුටු ඔබත් එලෙස උපාධිධාරණියක් වන්නට උනන්දුවෙන් කැපකිරීම තුළින් නිවැරදි ඉලක්කයක තම ගමන පෙරටම යනවා යන හැඟීම සිත තුළ ධාරණය කර ගන්නා ලෙස ආදරයෙන් සෙනෙහසින් මා ඉල්ලා සිටිනවා. ඔබට ජය ඒකාන්ත බව මගේ විශ්වාසයයි. ( මා ගැන පැවසුවේ නැතිබැරි කම තුළින් ගිය ගමන ගැන ඔබට ආදර්ශයක් දීම සඳහා ම පමණයි)

බාධක, දුක් කරදර, අඩුලුහුඩුකම් ජීවිතයට ආශිර්වාදයක් කරගෙන තම ඉලක්කය වෙනුවෙන් පෙරටම යන්න. ඔබට ජය ඒකාන්ත බව මගේ හැඟීමයි. දෙමාපියන් ඇතුලු පවුලේ සැම ආදරයෙන් මතක් කරන අතරම සැමට තිසරණ සරණ පතමින් අදට මා නවතින්නම්.

**මේ,**
**නුදුටු භාරකාර අම්මෙක්...**

# ආදරණීය අම්මේ... තාත්තේ...

**මේ ඔබෙන් ලද මහඟු දායාදයට කෘතගුණ එක්වූ සෙනෙහෙවන්ත සටහන්...**

**සනඳුරට ගතු කියන - මේ අඳුරු අහස තුළ**
**හිරු එළියක් - සඳ එළියක්**
**"අම්මේ තාත්තේ" ඔබ මට හැමදාමත්...**

| | |
|---|---|
| දුහුවිල්ලක ගත නැත පිස | දම්මා |
| සෙවණැල්ලක සිසිලස නිති | දුන්නා |
| සැනසිල්ලට අම රසකි | උතුම්මා |
| කෙදිනක හෝ නුඹ බුදු වෙයි | අම්මා |
| | |
| හිස මත දෑඟිලි මත යළි | නන්වා |
| හද ගැබ් කරනා ගී පද | ලිව්වා |
| ඔල්වරසන් මැද ගජිඳු | නිරින්ද |
| ඔබ ම ය පියතුමනී නිතියෙන් | මා |
| | |
| දුටුවා ගැබ් තුළ වැඩුණු | බිළින්ද |
| තුටුවා සියුමැලි රුවකි | දිලෙන්නා |
| සිතුවා ලොව මතු රජෙකු | කරන්නා |
| පැතුවා ලොව්තුරු සරණ | ලැබෙම්වා |
| | |
| ලය තුළ උතුරන ස්නේහය | දැනුනේ |
| ලෝකය ඔබ ම ය මාගේ | හැඟුනේ |
| නමදිමි මා ඔබෙ පා යුග | නිතිනේ |
| මතුවට බුදු වන මා පිය | රජුනේ |

**ආශිංසනා තත්සරණි - 11 ශ්‍රේණිය**

## කැපකරු මව්පියනි...

වැදූ මව්පියන් මෙලොවට
සමු දුන්නත් එදිනේ
කැපකරු වී ඔබ මා හට
සෙවණක් වුණි නිතිනේ
කෙදිනකවත් නෙත නොගැටුනු මුත්
ඔබ මා කෙලෙසේ
සරණක් වුණි සැමදා මට
ඔබෙ නොසිඳෙන සෙනෙහේ...

ලෝබ මසුරුකම් දුරුකොට
කළ මේ පින එකසේ
නිවන් මගට දෙරටු ඇරන්
දෙනු නියතයි ඔබගේ
තුති පුදකෙරුමට මා සතු
වත්කම් නැත අගනේ
සියලු පැතුම් ඉටු වේවා
එයයි පැතුම මාගේ...

අදටත් මා නොදනිමි
ඔබ කවුරුද යන වග
මව්පියෝ වෙන්නැති
ඔබ මගෙ පෙර අත් භවයක
කවදා හෝ දැකගන්නට
හැකි වේවිද නුඹ
කැපකරු මව්පියනි
මටත් දෙනවද අවසර...

**සිතුමි සස්මිතා - 12 ශ්‍රේණිය**

**නමෝ බුද්ධාය!**

**ගරුතර ස්වාමීන් වහන්සේගෙන් අවසර,**

ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා පොල් අතු සෙවිලි කළ නිවසේ සිටින මම තෝරා ගැනීම සම්බන්ධයෙන් පළමුකොට නමස්කාර පූර්වක කෘතඥතාව ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු අනෙකුත් ස්වාමීන් වහන්සේලාටත් කැපකරු දෙමව්පියන්ටත් කාර්යය මණ්ඩලයේ නැන්දලා මාමලාටත් ස්තූතිවන්ත වෙමි. මෙතරම් පොත් මිල අධික කාලයක ඉතාම වටිනා පොත් කට්ටලයක්, පැන්සල් පෑන් ආදී පාසැල් උපකරණ ලබා දීම මා හට නම් ඉතා වටිනා දෙයකි. පොත් මිල නිසාවෙන් මෙවර කවකටු පෙට්ටියක් මිලදී ගැනීමට මා හට නොහැකි විය. මා හට ලැබුනු කවකටු පෙට්ටිය ගණිතය විෂය සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. තිස්සමහාරාමයේ සිට පැමිණි මාගේ පියා ණයට මුදල් රැගෙන ශ්‍රද්ධා මාධ්‍ය ජාලය වෙත පැමිණි අතර, ගමන් ගාස්තු වශයෙන් ලබා දුන් මුදලද මට මහත් අස්වැසිල්ලකි. එදින උදෑසන ආහාරයවත් අපහට ගැනීමට නොහැකි වූ අතර, දැඩි කුසගින්නේ සිටි අපට දහවල් ආහාරය ලබා දුන් සහ ඊට මහන්සි වූ සැමටත් ඉතාමත් පින්.

මෙම ශිෂ්‍යත්ව වැඩසටහනෙන් මා හට ලැබුනු වවුචර් පත් මාරු කර ගිණුමට බැර කළ අතර, ඉදිරි මාසයේ ශිෂ්‍යාධාර මුදල සමඟ ම එම මුදලත් ගැනීමට මම අපේක්ෂා කරමි. එයින් කොමස් විෂය සඳහා උපකාරක පන්තියකට යෑමට මම බලාපොරොත්තු වෙමි. ලොකු ස්වාමීන් වහන්සේටත්, කැපකරු දෙමව්පියන්ටත්, ශ්‍රද්ධා කාර්ය මණ්ඩලයටත්, මම නැවතත් පින් දෙමි. තෙරුවන් සරණයි.

**මීට, ශිෂ්‍යත්වලාභී දියණිය**
**එස්. සයුරි නෙත්මිණි**

## නමෝ බුද්ධාය!

**කැපකරු දෙමව්පියන් වෙත,**

ආදරණීය අම්මේ තාත්තේ, ඔබ දෙදෙනා මගේ ම දෙමව්පියන් නොවූවත් කිසිදා දැක නැති මා වෙනුවෙන් ඉතා මහන්සියෙන් හම්බකරන ධනයෙන් යම් මුදලක් මා වෙත සෑම මසකම වෙන් කිරීමට තරම් කාරුණික වීම ගැන මම අවංකවම පිං දෙමි.

ඔබ මා වෙත පරිත්‍යාග කරන මුදල මම ඉතා අගය කොට සලකමි. මම ගණිතය, විද්‍යාව හා ඉංගීසි යන විෂයයන් 3ට අමතර පන්ති යමි. එම මුදල අම්මා අමතර පන්ති වලට දීම සඳහා යොදාගනී. මම ඉතා හොඳින් අධ්‍යාපන කටයුතු කරගෙන යමි. 7 ශ්‍රේණියේ අවසන් වාර විභාගයේදී ලකුණු 1189ක් ලබාගෙන පන්තියේ 1 වැනි ස්ථානය ලබාගත් අතර, 8 ශ්‍රේණියේ පළමු වාර විභාගයෙන් එම ලකුණුම ලබාගෙන 3 වැනි ස්ථානය ලබා ගතිමි. ප්‍රගති වාර්තාව ලැබෙනුයේ සැප්තැම්බර් මස 2 වැනි දින පන්තියේ පන්ති කවයක් තබා ඉන් අනතුරුව බැවින්, මගේ ප්‍රගති වාර්තාව ලැබුනු පසු එහි ඡායා පිටපතක් එවන්නම්.

මම මීට පෙර කිසිම දවසක බණ ඇසීමට කැමති වූයේ නැත. එහෙත් අම්මා හා ආච්චී නිතර ලක්විරු රේඩියෝ එකෙන් බණ අහනවා. අම්මා දවසක් සද්ධාසීල හාමුදුරුවන්ගේ බණක් මට අහන්න කථා කරා. අම්මා කතා කරපු නිසා මම බණ ඇහුවා. එදා ඉඳලා මම බණ අහනවා. මම වෙසක් පෝය දවසේ මුල් වරට උපෝසථ සීලය සමාදන් උනා. පැය 24 ක් යනකම්ම මුකුත් නොකා උපෝසථ සීලය රැක්කා. එදායින් පසු ගෙවුනු හැම පෝයකම උපෝසථ සීලය සමාදන් උනා.
ඒ පින ඔබ දෙපලට අනුමෝදන් වේවා!

මට ලැබුණු සදහම් සගරාව මම කියෙව්වා. එය කියවා මම මගේ ජීවිතය තවත් යහපත් කර ගන්න අධිෂ්ඨාන කරගත්තා. ඒ වගේම එම සදහම් සගරාවේ සඳහන්ව ඇති පරිදි මම වාසනාවේ සැබෑ ම උරුමකරුවෙකු බව මට සිතුනා. ඔබ දෙදෙනාට දීර්ඝායුෂ සහ නීරෝගී සුව ලැබේවා!

**මීට**

**දුලනි සහන්මා**



# ලක්ඛණමිග ජාතකය

ලක්ඛණ නම් මුවාගේ කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපි මේ යන්නේ හරිම භයානක සසර ගමනක. අප නො දැනීම නොයෙක් විපත්ති, කරදර, ආන්තරා වලට බඳුන් වෙනවා. අනුන්ගේ ගැටවලටත් නො දැනීම හසුවෙනවා. සත්පුරුෂයෝ කියලා හිතාගෙන අසත්පුරුෂයන්ට හසුවෙනවා. තමාත් දන්නෙම නැතුව අනුන් විසින් මෙහෙයවන බළල් අත් බවට පත්වෙනවා. එබඳු දෙයක් වුනොත් සෑහෙන්න පව් රැස්වෙනවා. කරදරේ වැටෙනවා. එබඳු වූ මහා විපතකට ලක්වෙන්න ගිය පිරිසක් බේරාගත් ප්‍රවෘත්තියකුයි මේ කථාවට පසුබිම් වුනේ. ඒ කතාව සිදුවුනේ මෙහෙමයි.

අපගේ භාග්‍යවතුන් වහන්සේගේ පහළ වීම නිසා ගොඩාක්ම වාසනාව උදාවුනේ ශාක්‍ය වංශයටයි. ගොඩාක් ප්‍රසිද්ධ ශාක්‍ය කුමාරවරු භාග්‍යවතුන් වහන්සේ ළඟ පැවිදි වෙන්න පටන් ගත්තා. එතකොට මහානාම ශාක්‍යයා හෝ අනුරුද්ධ ශාක්‍යයා යන දෙන්නාගෙන් කව්රුහරි පැවිදි වෙන්න ඕනා කියලා කතාවුනා. අන්තිමේදී අනුරුද්ධ කුමාරයා පැවිදි වෙන්න තීරණය කළා. අම්මාගෙන් අවසර ඉල්ලද්දී අනුරුද්ධ කුමාරයාට මෙහෙම කිව්වා.

"පුතණ්ඩ, ඔයා මොකද මහණ වෙන්නේ? එතකොට භද්දිය..! එයා ශාක්‍ය රාජ්‍යයේ රජකම් කරනවා. එයාට මහණ වෙන්ට කිසිම අදහසක් නැහැ... එහෙම නොවෙයි... භද්දිය ශාක්‍ය රජු පැවිදි වුනොත් මං ඔයාටත් පැවිදි වෙන්න අවසර දෙන්නම්"

එතකොට අනුරුද්ධ කුමරා භද්දිය ශාක්‍ය රජු හමුවෙන්ට ගියා. ගිහින් මෙහෙම කිව්වා. "අනේ... මගේ මිත්‍රය... මට උදව් කරන්න. මගේ මහණකම තියෙන්නේ ඔබේ අතේ !"

"එහෙම නම් මිත්‍රය... ඔයාගේ පැවිද්ද මගේ අතේ තිබ්බත් නැතත්, ඔබ මාත් එක්කම ගොහින් සුවසේ පැවිදි වෙන්න"

ඉතින් භද්දිය ශාක්‍ය රජුත්, අනුරුද්ධ කුමාරයාත්, ආනන්ද කුමාරයාත්, භගු කුමාරයාත්, කිම්බිල කුමාරයාත්, දේවදත්ත ත් කියන මේ ශාක්‍යවරු සය දෙනාත් උපාලි නමැති කරණවෑමියා ත් (බාබර්) සමග ගිහින් පැවිදි වුනා.

භද්දිය තෙරණුවෝත්, භගු තෙරණුවෝත්, කිම්බිල තෙරණුවෝත් රහත් ඵලයට පත්වුනා. අනුරුද්ධ තෙරණුවෝ දිවැස්ලාභීන්ගෙන් අග්‍ර වුනා. ආනන්දයන් වහන්සේ සෝවාන් ඵලයට පත්වුනා. දේවදත්ත ධ්‍යානලාභියෙක් වෙලා සෘර්ධි උපදවා ගත්තා. මේ සිද්ධිය වුනේ අපේ භාග්‍යවතුන් වහන්සේ මල්ලවරුන්ගේ අනුපිය නම් නියම්ගමෙහි වැඩවසද්දි. ඉතින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝයා පිරිවරාගෙන චාරිකාවේ වැඩියා. පිළිවෙළින් කොසඹෑ නුවරට වැඩියා. ඝෝෂිතාරාමයේ වැඩසිටියා. දේවදත්තත් ඒ චාරිකාවට සම්බන්ධ වුනා. ඔහුත් ඝෝෂිතාරාමයේ වාසය කළා. දවසක් දේවදත්ත මෙහෙම හිතුවා.

"හරි... මාත් දැන් කැපී පෙනෙන චරිතයක් ඇතිකර ගන්න ඕනා. මාත් ඒකපුද්ගල රංගනයක යෙදෙන්නට ඕනා. තනි චරිතයක් ලෙස ප්‍රසිද්ධියක් ඇතිකරගන්නට ඕනා. එතකොට බොහෝ දෙනෙක් මට පැහැදේවි. බොහෝ ලාභසත්කාර උපදීවි. හැබැට මං මේ වැඩේට ඉස්සෙල්ලාම පහදවා ගන්නේ කාවද...? හරි... අජාසත් තමයි ඔටුන්න හිමි කුමාරයා. ඔහු තාම තරුණයි. අනාගතේ රජා නොවැ. අජාසත්ව පහදවා ගත්තොත් වැඩේ හරි තමයි!" කියලා සිතුවා.

ඉතින් දේවදත්ත ඝෝෂිතාරාමයේ ඉඳලා සැලැස්ම ගහගෙන රජගහ නුවරට පිටත් වුනා. සෘද්ධි බලය යොදාගෙන අපූරු වැඩක් කළා. ලස්සන පොඩි කුමාරයෙකුගේ වේශයක් මවාගත්තා. හිස වටා, ඉන වටා, අත් වටා සර්පයන් වෙලාගෙන ඉන්න විදිහට මවාගත්තා. ඒ වෙලාවේ අජාසත් කුමාරයා තනියම වාඩිවෙලා හිටියේ. එක්වරම ඔහුගේ ඔඩොක්කුවේ මොහු පහළ වුනා. අජාසත් හොඳටම භය වුනා. ඇස් ලොකු වුනා. කෑගහගෙන උඩ පැන්නා. එතකොට දේවදත්ත මෙහෙම ඇහැව්වා.

"හහ්... හා... කුමාරය... ඔබ මට භයයි වගේ...!"

"අ... අනේ... ඇත්තෙන් ම... මං තමුන්නාන්සේට භයයි... හැබැට ම තමුන්නාන්සේ කව්ද?" කියලා බියෙන් වැඳගෙන ඇහැව්වා.

"කුමාරය... මං දේවදත්ත"

"අනේ... ස්වාමීනී. තමුන්නාන්සේ අපේ ආර්ය වූ දේවදත්තයාණෝ නම්, තමන්වහන්සේගේ ප්‍රකෘති වේශයෙන් පෙනී සිටින සේක්වා!"

එතකොට අර ළමයා නොපෙනී ගියා. ඉතා යහපත් ලෙස සිව්රු පොරවාගෙන පාත්‍රය, දෙපට සිවුර ඇතිව දේවදත්තයා ශාන්ත ඉරියව්වෙන් පෙනී සිටියා. අජාසත් කුමාරයා එතනම දිගාවෙලා වැඳ වැටුනා. දේවදත්තගේ දෙපා වැළඳගෙන සිඹින්න පටන් ගත්තා.

දැන් වැඩේ හරි. අජාසත් කුමාරයා හොඳටම පැහැදුනා. අජාසත් කුමාරයා සේනාව පිරිවරාගෙන බත් හැලි පන්සීයක දානෙ රැගෙන දෙව්දතුන්ට උපස්ථානයට යනවා.

එතකොට දෙව්දත්ට මෙහෙම හිතුනා. හරි දැන්... මං තමයි සංඝයාව පාලනය කරන්ට සුදුසු. මං සංඝරාජ වෙන්ට ඕනා" කියලා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, කුසලය කියන්නේ හරීම අසිරිමත් දෙයක්. කුසලය කවරදාකවත් අකුසලය සමඟ එකතු වෙන්නෙ නෑ. ආලෝකය කවරදාකවත් අඳුර සමඟ එකතු වෙන්නේ නෑ වගේ. අන්න ඒ වගේ දේවදත්ත සංඝයාගේ පාලනය තමන්ගේ අතට ගෙන සංඝරාජ වෙන්ට හිතුවා විතරයි, අකුසල් සිත පහළ වූ සැණින් ම ඔහුගේ ධ්‍යානය නැතිවුනා. ඉර්ධිබල නැතිවෙලා ගියා.

ඒ කාලේ අපගේ මහාමොග්ගල්ලානයන් වහන්සේගේ උපස්ථායකයෙකුව සිටි කෝලිය රාජපුත්‍ර කකුධ උපාසක මිය ගිහින් හිටියේ. මනෝමය සිරුරක් ඇතිව දෙව්ලොව ඉපිද සිටි ඔහු දෙව්දත්ට වෙච්ච දේ දැක්කා. දැකලා මහා මොග්ගල්ලානයන් වහන්සේ ඉදිරියේ පෙනී සිට මේ ප්‍රවෘත්තිය සැළකළා.

මහාමොග්ගල්ලානයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ළඟට වැඩියා. වැඩම කරලා භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට කකුධ දිව්‍ය පුත්‍රයා විසින් තමන්ට පැවසූ කරුණ සැළකළා.

"මොග්ගල්ලානයෙනි, ඔය කකුධ දිව්‍ය පුත්‍රයා දේවදත්ත

ගැන පැවසූ දේ ඇත්තක් ම ද කියලා ඔබ දේවදත්තගේ සිත ගැන තම සිතිනුත් විමසා බැලුවාද?"

"එහෙමයි ස්වාමීනී, කකුධ දිව්‍ය පුත්‍රයා කියූ දෙය ඇත්තක් ම යි. මං දේවදත්ත ගේ සිත මගේ සිතින් පිරිසිඳ දැනගත්තා"

මොග්ගල්ලානයෙනි... ඔය කාරණය කාටවත් නොකියා ඉන්න. එහෙම වුනොත් ඔය හිස් පුරුෂයා තමන් එහෙම දෙයක් සීනෙකින්වත් සිතුවේ නෑ කියලා ඔබට පෙරලා පහර දේවි. ඔබ නිහඬව ඉන්න. ඔය හිස් පුරුෂයා තමන්ම හෙළිදරව් කරගනීවි"

එතකොට අපගේ භාග්‍යවතුන් වහන්සේ සංඝයා පිරිවරාගෙන නැවතත් චාරිකාවේ වැඩියා. පිළිවෙළින් චාරිකාවේ වැඩමකොට රජගහනුවරටත් වැඩියා. රජගහනුවර වේළුවනයේ වැඩසිටියා.

දවසක් භාග්‍යවතුන් වහන්සේ බිම්සර රජු සහිත මහා පිරිසක් මැද වේළුවනයේ දහම් දෙසමින් වැඩසිටියා. එදා දේවදත්තත් බණ අහන විදිහට සංඝයා මැද වාඩිවෙලා සිටියා. එක්වරම පිරිස මැදින් නැගිට්ටා. මහා ගරුසරු බවක් පෙන්නලා වැඳගත්තා. මෙහෙම කියා හිටියා.

"අනේ... ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මං හරිම සංවේග යෙන් ඉන්නේ. භාග්‍යවතුන් වහන්සේ මේ සංඝයා පරිහරණය කරන්ට ගොහින් හරියට වෙහෙසෙනවා. අනික භාග්‍යවතුන් වහන්සේ දැන් සෑහෙන්න දුර්වලයි. මහලුයි. වයෝවෘද්ධයි. දැන් භාග්‍යවතුන් වහන්සේ මේ බාහිර වැඩ ගැන උත්සාහවත්

නොවී හුදෙකලාවේ විවේක සුවයෙන් වාසය කරන්ට කාලයයි. භික්ෂු සංඝයාව මට භාරදෙන සේක්වා. මං භික්ෂු සංඝයාගේ දියුණුව පිණිස පාලනය කරන්නම්"

"දේවදත්ත... ඔය අදහස අත්හරින්න. සංඝයා පාලනය කිරීමේ අදහස ඔබට රුචි නො වේවා!"

භාග්‍යවතුන් වහන්සේ මෙහෙම වදාළ විට දේවදත්ත තුන්වතාවක් ම එහෙම සංඝයාගේ පාලනය ඉල්ලා සිටියා. එතකොට භාග්‍යවතුන් වහන්සේ මෙහෙම වදාළා.

"දේවදත්ත, මං සාරිපුත්ත මොග්ගල්ලානයන්ටවත් සංඝයාගේ පාලනය භාරදෙන්නෙ නෑ. මිථ්‍යා ආජීවයෙන් ජීවත් වෙන ඔබ වැනි කෙනෙක්ට මං සංඝයා භාරදේවිද?"

එතකොට දේවදත්ත භාග්‍යවතුන් වහන්සේට වන්දනා කළා. නිශ්ශබ්දව පිටත් වෙලා ගියා. මෙහෙම හිතුවා.

"හහ්... පෙනේද!... රජුන් සහිත පිරිස මැද්දේ මං මිථ්‍යා ආජීවෙන් ජීවිකාව ගෙවනවා කිව්වා. සාරිපුත්ත, මොග්ගල්ලානයන්ව ඉහළින් තිබ්බා... හහ්... හොඳයිකෝ...මං බලාගන්නම්... කව්ද දිනන්නේ බලමු" කියලා වෛරය ඇතිකරගත්තා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, අසත්පුරුෂයෙක් වෛර බැඳගත්තාම කරන දේ ගැන භාග්‍යවතුන් වහන්සේ තරම් දන්න කෙනෙක් ලෝකයේ වෙන නෑ. දේවදත්ත කිසියම් අර්බුදයක් උපදවා විනාශයක් කරන්නට කලින් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා වදාළා.

" මහණෙනි, සංඝයා විසින් දේවදත්ත ගැන ප්‍රසිද්ධ ප්‍රකාශයක් රජගහනුවරදී කළ යුතුයි. 'කලින් දේවදත්තගේ තිබුනේ වෙනත් තත්වයක්. දැන් තිබෙන්නේ වෙනත් තත්වයක්. ඒ නිසා දැන් දේවදත්ත මොනවා කිව්වත්, කළත් එයින් බුදුරජුන් හෝ බුදුරජුන් ගේ ධර්මය හෝ ශ්‍රාවක සංඝයා හෝ නියෝජනය නොකරන බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ යුතුයි"

ඊටපස්සේ භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්තයන් වහන්සේ ඇමතුවා.

"එහෙමනම් සාරිපුත්තයෙනි, ඔබ රජගහනුවරට ගිහින් දේවදත්ත ගැන ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ යුතුයි.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මං කලින් රජගහනුවරදී දේවදත්ත ගැන මහා ඍර්ධිමතෙක් හැටියට, මහානුභාව සම්පන්න භික්ෂුවක් හැටියට වර්ණනා කරලා තියෙනවා නොවැ. ඉතින් මං දේවදත්ත ගැන කොහොමද ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්නෙ?"

"හරි සාරිපුත්ත... එදා ඔබ කිව්වේ දේවදත්ත ගැන සැබැවින්ම තිබුණ දෙයක් නේද?"

"එහෙමයි ස්වාමීනී"

"අන්න ඒ වගේම සාරිපුත්තයෙනි, දැනුත් දේවදත්ත ගැන සැබැවින්ම තියෙන දේ ගැන කියන්න"

ඉතින් සාරිපුත්ත මහ රහතන් වහන්සේ බොහෝ භික්ෂූන් පිරිවරා රජගහනුවරට වැඩියා. ප්‍රසිද්ධියේ දේවදත්තගේ

ස්වභාවය ගැන ප්‍රකාශ කළා. එතකොට දේවදත්තට පැහැදිලා හිටපු මිනිස්සු මෙහෙම කියන්න ගත්තා.

"යසයි වැඩේ... දේවදත්ත කොයිතරම් දක්ෂ ද... මොනතරම් පින්වන්ත ද... ඔයතරම් ලාභසත්කාර ප්‍රශංසා ලැබෙන්නේ උන්වහන්සේ ගේ පිනට නොවැ. ඉතින් එහෙම එකේ මේ අනික් ශ්‍රමණයන් වහන්සේලා ඕකට ඉරිසියා කොරන්නේ මක්කටෙයි?"

තෙරුවන් හඳුනාගෙන අවබෝධයෙන් ම ශ්‍රද්ධාවට පත් පිරිස් මෙහෙම කිව්වා.

"හරි... හරි... මේකේ මොකාක් හරි බරපතල කාරණාවක් තියෙන්නම ඕනා. ඒක නිසාමයි භාග්‍යවතුන් වහන්සේ විසින් දේවදත්ත ගැන මෙවැනි ප්‍රසිද්ධ ප්‍රකාශක් කරවා වදාළේ. ඒ නිසා දේවදත්ත මොනවා කිව්වත්, මොනවා කෙරුවත් ඒ තුළින් අපේ භාග්‍යවතුන් වහන්සේව හෝ ධර්මය හෝ සංඝයා හෝ නියෝජනය නොවන බවට අපිත් අද පටන් සැලකිය යුතුයි"

දෙව්දත් කලින් ම අජාසත්ව නො මග යවලයි තිබුනේ. තමන් බුදුන් මරා සංඝරාජ වන බවටත් ප්‍රතිඥා දුන්නා. නොයෙක් උපක්‍රම කරමින් අපගේ භාග්‍යවතුන් වහන්සේ ගේ ජීවිතය විනාශ කරන්නට බොහෝ උත්සාහ කළා. බද්ධ වෛරයෙන් යුතුව දිගින් දිගට ම බුදුරජුන් විනාශ කරන්නට වෙහෙසෙන දේවදත්ත ගැන ජනයා තුළ අප්‍රසාදය ඇතිවුනා. ලාභ සත්කාර නැතිව ගියා. තමන්ට දානෙ ටිකක් දෙන්න කෙනෙක් නැතිව ගියා. එතකොට දේවදත්ත තමන්ගේ ශ්‍රාවක පිරිසත් සමග ගෙවල් ගානේ ගොහින් තමන්ව භාග්‍යවතුන්

වහන්සේ ඉතා අසරණ බවට පත්කරවූ බව පවසමින් ඉල්ල ඉල්ලා දානෙ ගන්න පුරුදු වුනා. අන්තිමේදී දේවදත්ත සංඝභේදය කරන්නට තීරණය කළා. තමන්ට හිතවත්ව ඉන්න කෝකාලික, කටමෝරක තිස්ස, ඛණ්ඩදේවී පුත්‍ර, සමුද්‍රදත්ත යන භික්ෂූන්වත් මෙයට යොදාගත්තා. දහම නො දන්නා පොදු ජනයාවත් නවක භික්ෂූන්වත් පහදවා ගනු පිණිස ප්‍රතිපත්ති පහක් සකසා ගත්තා.

1. භික්ෂූන් දිවි තිබෙන තුරු අරණ්‍යයේ ම වාසය කළ යුතුයි. ගමේ වාසයට පැමිණියොත් ඔහු වරදක් කළා වෙයි.

2. භික්ෂූන් දිවි තිබෙන තුරු පිණ්ඩපාතයෙන් ලැබෙන දානයෙන් යැපිය යුතුයි. ආරාධනාවක් පිළිගත්තොත් ඔහු වරදක් කළා වෙයි.

3. භික්ෂූන් දිවි තිබෙන තුරු පාංශුකූල වස්ත්‍රයෙන් කළ සිවුරු පෙරවිය යුතුයි. ගිහියන් පිදූ සිවුරක් පිළිගත්තොත් ඔහු වරදක් කළා වෙයි.

4. භික්ෂූන් දිවි තිබෙන තුරු රුක් සෙවනේ විසිය යුතුයි. වහළක් සෙවිලි කළ තැනකට ගොඩ වුවහොත් ඔහු වරදක් කළා වෙයි.

5. භික්ෂූන් දිවි තිබෙන තුරු මස් මාළු නොවැළඳිය යුතුයි. යමෙක් මස් මාළු වැළඳුවොත් ඔහු වරදක් කළා වෙයි.

ඉතින් දේවදත්ත මේ ප්‍රතිපත්ති පහ නිවනට ඉතා ළංව ඇති දෙයක් බවත් ඒවා භික්ෂූන් උදෙසා අනුමත කරන ලෙසත් භාග්‍යවතුන් වහන්සේගෙන් ඉල්ලා සිටියා. භාග්‍යවතුන්

වහන්සේ මේ ඉල්ලීම පහ ම ප්‍රතික්ෂේප කළා. ඔහු හිතපු දේ හරි ගියා. දැන් දේවදත්තට හරි සතුටුයි. ඔහුත් රජගහනුවර දී ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළා.

"පින්වත්නි, අපි ශ්‍රමණ ගෞතමයන් මුණගැහෙන්න ගියා. මේ ඉතාම වටිනා අති ශ්‍රේෂ්ඨ ගුණධර්ම පස සංඝයාට පනවන්න කියලා ඉල්ලා සිටියා. බලන්න පින්වත්නි, අල්පේච්ඡ බව, වීර්යය ඇතිවෙන මේ උදාර පංච ප්‍රතිපත්තිය ප්‍රතික්ෂේප කළා නොවැ. නමුත් මේ නිවන් මග ස්ථිරව ගමන් කිරීම අපේ අදහසයි. ඉතා අල්පේච්ඡ වූ පැරණි සසුන් වැඩපිළිවෙළ අපි නැවත ඇති කරන්න තීරණය කළා. ඒ අනුව අධිෂ්ඨානශීලිව මේ ප්‍රතිපත්ති අනුගමනය කරන්නට අපි පෙළ ගැහෙනවා"

මෝඩ මිනිස්සු පැහැදුනා. දෙව්දත්ට උදව් කරන්න පටන් ගත්තා. බුදු සසුන හඳුනාගෙන සිටි සැදැහැවතුන් දෙව්දත් කෙරෙහි වඩාත් කළකිරුණා. "හප්පේ... මේ පාර දේවදත්තයා සංඝභේදය කොරන්ඩ නොවැ මේ වක්‍ර ගමනින් ලේස්ති වෙන්නේ" කියලා දොස් කිව්වා.

ඔය අතරේ අපගේ සාරිපුත්ත මහරහතන් වහන්සේ ළඟ මෑතක දී පැවිදි වූ නවක භික්ෂූන් පන්සිය නමක් හිටියා. ඒ නවක භික්ෂූන්ව නො මග යවන්න දෙව්දත් සමත් වුනා. ඒ පිරිසට දෙව්දත් ගේ උපකාරයෙන් සංසාරයෙන් එතෙර වෙන්න පුළුවන් බවට විශ්වාසය ඇති කෙරෙව්වා. දෙව්දත් සංඝභේදය නමැති භයානක වූ ආනන්තරිය පාපකර්මය කළා. ඒ පන්සියයක් වූ භික්ෂු පිරිස රැගෙන ගයා ශීර්ෂය කරා ගියා.

එතකොට භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්ත-මොග්ගල්ලාන රහතන් වහන්සේලා අමතා වදාළා.

"සාරිපුත්තයෙනි, ඒ නවක භික්ෂූන් කෙරෙහි ඔබ තුළ කරුණාව තිබිය යුතුයි නොවැ. සාරිපුත්තයෙනි, ඒ භික්ෂූන් විනාශයකට පත්වෙන්නට කලින් එහි යන්න"

ඉතින් සාරිපුත්ත-මොග්ගල්ලාන රහතන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට ගයා ශීර්ෂය බලා පිටත් වුනා. දෑගසව්වන් වහන්සේලා ගයා ශීර්ෂයට වඩින බව දුටු එක්තරා භික්ෂුවක් හඬන්න පටන් ගත්තා. එතකොට භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුව ඇමතුවා.

"ඇයි භික්ෂුව ඔබ ඔය හඬන්නේ?"

"අනේ... ස්වාමීනී... අපගේ සාරිපුත්ත මොග්ගල්ලාන දෑගසව්වන් වහන්සේලාත් දේවදත්තගේ දහමට ආසාවෙන් ගයා ශීර්ෂයට වඩිනවා නොවැ"

"නෑ භික්ෂුව... එය කිසිදාක සිදුවන දෙයක් නොවෙයි. ඒ දෙනම වඩින්නේ කලින් ගිය භික්ෂූන්ට සිහිය උපද්දවන්නයි"

ඉතින් එදා දේවදත්ත මහත් පිරිස් පිරිවරාගෙන ධර්මය දේශනා කරමින් සිටියා. සාරිපුත්ත මොග්ගල්ලානයන් වහන්සේලා ඈතින්ම වඩින අයුරු දැක්කා. දැකලා මෙහෙම කියනවා.

"මහණෙනි, මා විසින් මොනතරම් යහපත් ලෙස ධර්මය කියන ලද දැයි බලව්. අර ශ්‍රමණ ගෞතමයන් ගේ අග්‍රශ්‍රාවක දෙපළ මෙහි වඩින අපූරුව බලව්. මං කියන්නේ හරි දෙයක් බවට ඒ දෙනමටත් කැමැත්ත ඇති වූ සැටියෙන් පෙනෙනවා නේද!"

එදා දෙව්දත් රෑ බොහෝ වෙලා දහම් දෙසුවා. අකුසල් දුරුකිරීමේ කුසල් වැඩීමේ අවංක අදහසින් අසත්පුරුෂයෙකුගේ බණ අසමින් ඒ භික්ෂූන් ද ඒ රාත්‍රියෙහි දෙව්දත් බණ අසාගෙන සිටියා. ඊට පස්සේ දේවදත්තයා අපගේ සාරිපුත්තයන් වහන්සේ ඇමතුවා.

"එම්බා සාරිපුත්තයෙනි, දැන් මේ භික්ෂූන් බොහෝ වේලාවක් මාගේ දහම් අමාවෙන් පිනායමින් මහත් සැනසිල්ලක් ලබමින් ඉන්නේ. මාගේ පිට ස්වල්පයක් රිදෙයි. ඒ නිසා මා ස්වල්ප මොහොතක් පිට දිගහැර හාන්සි වෙන්නම්. ඔබ මේ භික්ෂූන්ට දහම පවසන්න" කියල දේවදත්තත් දකුණු ඇලයෙන් හාන්සි වුනා. මහත් වෙහෙසට පත්ව, සිහි මුළාව සිටි දේවදත්තට සැණෙකින් නින්ද ගියා.

එතකොට සාරිපුත්තයන් වහන්සේ ඉතා රමණීය ලෙස නිර්මල ශ්‍රී සද්ධර්මය වදාළා. මහා මොග්ගල්ලානයන් වහන්සේ ඍර්ධි ප්‍රාතිහාර්යයන් තුළින් ධර්මයෙන් කියැවෙන අරුත් මවලා පෙන්නුවා. සත්පුරුෂයන් ගේ ධර්මයට සවන් දුන් ඒ භික්ෂූන් පන්සිය දෙනා වහන්සේ ම සෝවාන් ඵලයට පත්වුනා.

ඉතින් සාරිපුත්තයන් වහන්සේ මෙසේ වදාළා.

"ඇවැත්නි, අපි දැන් භාග්‍යවතුන් වහන්සේ වෙත වඩිනවා. භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්මයට කැමැති අයට අපත් සමග එන්න පුළුවනි"

ඉතින් ඒ පන්සියයක් භික්ෂූන් වහන්සේලාත් අපගේ දැගසව්වන් වහන්සේලා සමග වේළුවනයට පිටත් වුනා.

සාරිපුත්තයන් වහන්සේ ඒ පන්සියයක් භික්ෂූන් රැගෙන වැඩමවීම ගැන අනිත් භික්ෂූන් මහත් සතුටට පත්වුනා. අස්වැසිලි ලැබුවා. බුදුරජාණන් වහන්සේටත් මේ ගැන මහත් පැහැදීමෙන් කතා කළා.

"ස්වාමීනී... අපගේ ධර්මසේනාධිපතීන් වහන්සේ ඒ පන්සියයක් භික්ෂූන් සමග වඩිද්දී හරිම ලස්සනයි නොවැ. හරිම සෝභමානයි... දේවදත්ත තවත් පිරිහිලා ගියා"

"මහණෙනි... නෑ පිරිවර ඇතිව සාරිපුත්තයන් පෙර ආත්මයකත් බැබලුනා. දේවදත්ත ඒ ආත්මෙත් පිරිහිලා ගියා"

එතකොට අතීතයේ සැඟවී ගිය ඒ සිදුවීම කියාදෙන්නැයි භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගෙන් ඉල්ලා සිටියා. ඒ අවස්ථාවේදී අපගේ භාග්‍යවතුන් වහන්සේ මේ ලක්ඛණමිග ජාතකය වදාළා.

"මහණෙනි, ඉතා ඉස්සර කාලෙක රජගහනුවර මගධ රාජ්‍යයේ එක්තරා රජෙක් වාසය කළා. ඒ කාලයේ බෝධිසත්වයෝ මුව යෝනියෙහි ඉපදිලා සිටියේ. දහසක් මුවන් පිරිවරාගෙන මහා වනාන්තරේ වාසය කළා. ඉතින් ඔය මුව රජ්ජුරුවන්ට ලක්ඛණ නමිනුයි කාල නමිනුයි පුතුන් දෙදෙනෙක් සිටියා. මේ බෝසත් මුවා වයස්ගත වෙද්දි තමන්ගේ පුත්‍ර මුවන් දෙන්නාට කතා කළා.

"දරුවෙනි, මං දැන් මහලුයි. මේ මුව පිරිස පරිහරණය නුඹලාට භාරයි" කියල පන්සියය බැගින් දෙකොටසකට බෙදලා පුත්‍ර මුවන් දෙන්නාට භාර දුන්නා. එදා පටන් ඒ දෙන්නා මුව පිරිස හික්මවන්න පටන් ගත්තා.

ඒ දවස්වල මගධ රටෙහි ගොයම් පැහුනු කාලෙට කුඹුරු රකින්න සෑහෙන්න මහන්සි වෙන්න ඕනා. වනාන්තරේ ඉඳන් එන මුවන්ගෙන් කුඹුරට කරදරයි. එතකොට ගොයම් කන්ට එන මුවන්ව මරාදමන්න තැන් තැන්වල උගුල් අටවලා තිබ්බා. වලවල් කැණලා තිබ්බා. ඒ වලවල් ඇතුලේ තියුණු උල් සිටවලා තිබ්බා. මුවන්ව විනාශ කරන්න නොයෙක් විදියේ කූට උපායයන් යොදවලා තිබ්බා.කුඹුරු රකින කාලෙට මුවන්ට සිදුවෙන විපත් ගැන දන්න බෝධිසත්වයෝ තම පුත්‍ර මුවන් දෙන්නා කැඳවලා මෙහෙම කිව්වා. "දරුවෙනි, දන්නවා නොවැ. මේ කුඹුරු රකින කාලේ. මේ කාලෙ අපේ මුවෝ හරියට මැරෙනවා. අපි දැන් මහලුයි. මොකාක් හරි උපායකින් මහළු මම පරෙස්සම් වෙන්නම්. නුඹලා ඔය මුව පිරිසත් එක්ක වනාන්තරේට පලයං. කඳු වලල්ල අස්සේ ජීවත් වෙලා කුඹුරු කැපුනාට පස්සේ ආපහු වරෙන්"

එතකොට ඒ මුවෝ දෙන්නා පිය මුවාගේ වචනය අහලා පිරිසත් සමග පිටත් වුනා. මුවන්ගේ ගමන් මාර්ගය ගැන මිනිස්සු හොඳට දන්නවා. මේ කාලෙ මුවන් කන්ද නගිනවා. මේ කාලෙට වනාන්තරෙන් ගමට වදිනවා කියල හොඳට දන්නවා. ඉතින් ඒ මිනිස්සු තැන් තැන්වල සැඟවිලා හිටියා. බොහෝ මුවන්ව මරාගත්තා.

කාල නමින් හිටිය මුවාට මේ ගැන වැටහීමක් තිබුනෙ නෑ. ඒ මුවා උදේත්, සවසත්, ගොම්මන් වෙලාවටත්, අලුයමත් ගමේ පාරෙන් යනවා. මිනිස්සු ඒ වෙලාවට කොහොමත් සැඟවිලා ඉන්නෙ. ඉතින් ඒ මුවාගේ මෝඩකම නිසා ගොඩාක් මුවන් මරණයට ලක්වුනා. වනාන්තරේට යාගන්න පුළුවන් වුනේ ටික දෙනාටයි. ලක්ඛණ මුවා එහෙම නොවෙයි. ඒ මුවා

දක්ෂයි. හොඳට කරුණු වැටහෙනවා. තැනට සුදුසු නුවණ තියෙනවා. යා යුතු නොයා යුතු වෙලාව හොඳට වැටහෙනවා. ඒ නිසා ඒ ලක්ඛණ මුවා ගමේ පාරෙන් යන්නෙම නෑ. දහවල් යන්නෙත් නෑ. ගොම්මන් වෙලාවේ අඩ අඳුරේ යන්නෙත් නෑ. අළුයම යන්නෙත් නෑ. මධ්‍යම රාත්‍රියටයි යන්නේ. නිවැරදි වෙලාවට ගිය නිසා එක මුවෙකුටවත් විපතක් නොවී එකට ම යන්න පුළුවන් වුනා. කරදර කාලෙ අවසන් වුනා ම ඒ පන්සියයක් මුවරැළ සමග ආයෙමත් තම දෙමාපියන් ළඟට එන්ට පුළුවන් වුනා. කාල මුවා සියලු මුවරැළ විනාස කරගෙන තනියම ආවා. මෙය දුටු බෝසත් මුවා මෙහෙම කිව්වා.

"නිවැරදි ලෙස තේරුම් ගෙන කටයුතු කළ හැකි කෙනා
ලක්ඛණ මුව පුතු එන ලෙස නෑ පිරිවර සමගිනා
හොඳින් බලා සිතට ගනිව් කළ යුතු දෙය දැනගෙනා
බලව් කාල මුව එන හැටි නෑ පිරිවර වැනසුනා"

"මහණෙනි, අපේ සාරිපුත්තයන් දැනුත් නෑදෑ පිරිවර ධර්මයෙහි යොදවලා බුදු සසුන ශෝභමාන කරනවා. කලින් ආත්මයේත් මුව පිරිවරට යහපත සදලා මුවරැළ ශෝභමාන කළා. දේවදත්ත මේ ආත්මේත් පිරිවරින් පිරිහිලා ගියා. එදාත් පිරිහිලා ගියා. එදා කාල මුවා වෙලා හිටියේ දේවදත්ත. වැනසුනෙත් දේවදත්තගේ පිරිස ම යි. ලක්ඛණ මුවා වෙලා හිටියේ අපේ සාරිපුත්තයන්. ඔහුගේ පිරිස වුනේ බුදු පිරිස ම යි. මව් මුවදෙන වෙලා හිටියේ රාහුලමාතාවෝ. පිය මුවරජු වෙලා හිටියේ මං නොවැ"

පින්වතුනේ, පින්වත් දරුවනේ, මේ සසරේ ස්වභාවය නම් සිතාගන්නට නොහැකි තරම් පුදුම සහගතයි. එක ම දේ වෙනත් වෙනත් ක්‍රම වලින් නැවත නැවතත් වෙනවා. ඒ නිසා අපි තමාටත් අනුන්ටත් යහපත, හිත සුව පිණිස හේතුවන දේ පමණක් කරන්නට පුරුදු වෙමු.



# හොඳ
# සවන්දෙන්නෙක්
# වෙන්න

**පින්වත් දුවේ පුතේ,**

ඔබට වගේ ම දුවේ පුතේ අපටත් පාසල් පන්ති කාමරවල ගෙවී ගිය ජීවිත කාලයක් තිබුණා. දයාබර ගුරුතුමා, ගුරුතුමී අපේ ජීවිතවල වීරයන් බවට පත් වුණ..., අදටත් ආදරයෙන්, ගෞරවයෙන් සිහිකරන මතක සටහන් අපේ ජීවිත ඇතුළේ ඉතිරි කරපු..., මඟ නොමඟ වෙන් කර දකින පදනම අපේ ජීවිත තුළ ගොඩනගපු ඒ පාසල් අවදියේ ඔබ වගේ ම තමයි අපත්...,

පන්ති කාමරයේ ගුරුවරුන් නැති සැණෙකින් අපේ හඬවල් එකිනෙකා පරයා නැගුණු අවස්ථා තමයි වැඩි. හැබැයි, දැනුමෙන් සහ අත්දැකීමෙන් වැඩි වැඩී යද්දි තමයි අපටත් තේරුණේ අපට එක කටක් සහ කන් දෙකක් ලැබෙන්නට ඇත්තේ අඩුවෙන් කථා කරන්නත්, වැඩියෙන් සවන් දෙන්නත් වෙන්න ඕනි කියලා...! අද අපි ඔබට කියා දෙන්නෙත් ඒ පාඩම. මේක පාසල් ජීවිතයට විතරක් නෙමෙයි; මුළු ජීවිත කාලයට ම ඔබ ව සුවපත් කරලන මහඟු පාඩමක් ම වේවා!!!

දුවේ පුතේ, මේ ලෝකයේ ජීවත් වන උදවියගේ ප්‍රශ්න ගැන අපට නොයෙක්වර අසන්නට ලැබෙනවා. ගෙදරක වුණත්, ගමක වුණත්, වැඩබිමක වුණත් ප්‍රශ්න නම් හිඟ වෙන්නේ නැහැ. ඔය බොහෝ ප්‍රශ්න කථා කෙරෙද්දි නිතර ඇහෙන දෙයක් තමයි, "ඒ අය මට කන් දෙන්නේ නැහැ, ඒ අය මං කියන දේ තේරුම් ගන්නේ නැහැ, ඒ අය මම කියන දේ අහන්නේ නෑ" කියන එක. ඇත්තටම දුවේ පුතේ, ලෝකයේ හොඳ සවන් දෙන්නන් දුර්ලභයි. සවන් දීමෙන් ම පමණක් වුණත් විසඳෙන ප්‍රශ්න බොහොම පීඩාකාරී විදිහට ජීවිත පුරා පැතිර යන්නේ '**හොඳ සවන් දෙන්නෝ**' දුර්ලභ නිසයි.

අප ජීවත් වන වටපිටාව තේරුම් ගන්නත්, සමාජය හඳුනා ගන්නත්, අපේ වටපිටාවේ උදවිය පත් වෙලා සිටින සැබෑ තත්ත්වයන් දැනගන්නත් 'සවන් දීම' බොහොම උපකාරකයි.

ඒ නිසා, කවුරු වුණත් දෙයක් කියනකොට ඒ කාරණය කියන්න ඉඩ හරින්න. මැදින් කරුණු දක්වන්නට ගිහින් ඒ කථාබහට බාධා වන්නට දෙන්න එපා. එහෙම බාධා කරන්නට ගියොත්, ඔබට බොහොම වටිනා දේවල් ලැබෙන ඉඩ වුණත් එයින් මගහැරී යන්නට පුළුවනි. සූත්‍ර පිටකයේ ඇතැම් දේශනා කියවද්දී දකින්න ලැබෙනවා මග ඵල ලබන්න පවා පින් තිබුණු ඇතැම් උදවිය සම්බුදුරජාණන් වහන්සේගේ දහම් කථාව කෙරෙමින් තිබිය දී අන් කටයුතු බොහෝ බව පවසමින් නැගිට යාම නිසා මග ඵල ලබන වාසනාව අහිමි කර ගත් බව (උදා. කන්දරක සූත්‍රය, ම. නි. 2). ඒ නිසා, හොඳට තේරුම් ගන්න ඇහුම්කන් නොදීම නිසා අපට බොහෝ ලාභයන් නොලැබී යන්නට ඉඩ තිබෙන බව...

කෙනෙකුගේ ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න වුණත් ඒ කෙනා කියන කාරණය මොකක්ද කියලා අපි මුලින් තේරුම් අරන් ඉන්න ඕනේ. එහෙම නොවුණොත් අපි දෙන පිළියම අසාර්ථකයි. සාර්ථක සමාජ සම්බන්ධතා ගොඩනගද්දි 'සවන් දීම' බොහොම වැදගත් ගුණධර්මයක් වෙන්නේ ඒ නිසයි. කවුරු වුණත් කමක් නැහැ; යම් කාරණයක් කියද්දී එයට අවදානයෙන්, හොඳින් කන් දීම ඔබේ පුරුද්දක් කර ගන්න...!

බලන්න අපි සරණ ගියපු ශාස්තෘන් වහන්සේගේ අසිරිමත් ජීවිතය දිහා... උන්වහන්සේ කරා නොයෙක් මත තිබෙන, නොයෙක් දුක් තිබෙන, නොයෙක් සමාජ මට්ටවල සිටින, නොයෙක් හැසිරීම් රටා තිබෙන උදවිය එළඹුණා

නේද... අක්කෝසක භාරද්වාජ බමුණා සම්බුදුරජාණන් වහන්සේ කරා තරහ සිතින් ඇවිත් නින්ද අපහාස කරද්දී උන්වහන්සේ ඒ බැණුම අවසන් වන තුරු ම සවන් දුන්නා. පසේනදී කෝසල රජතුමා සම්බුදු සිරිපා හිසෙන් වන්දනා කරමින් තෙරුවන් ගුණ කියාපාද්දිත් සම්බුදුරජාණන් වහන්සේ සවන් දුන්නා. කිසාගෝතමිය මළ දරුවාත් රැගෙන සිහි විකල් වී පැමිණ මළ පුතුට පණ ගෙනෙන ඔසුවක් ඉල්වද්දීත් සම්බුදුරජාණන් වහන්සේ සවන් දුන්නා. දිව්‍ය ආයුෂ ගෙවී ගිය සක් දෙවිඳුගේ පණිවිඩකරුවා ලෙස පැමිණි පන්සිළු දිව්‍යපුත්‍රයා වීණාව වයමින් සූරිවච්චසා දෙව්දුව ගැන වර්ණනා කරද්දීත් සම්බුදුරජාණන් වහන්සේ සවන් දුන්නා. තුන්ලොව අග පැමිණි, මහා බඹු විසින් ද සේවාකම් කරනු ලබන ඒ මහා පුරුෂ වීරයාණන් වහන්සේ පවා ඒ ඒ අයගේ ප්‍රශ්නවලට පිළියම් යෙදුවේ සවන් දීමෙන් පසුවයි. ඒ හැම දෙනෙක් ම වගේ සසර දුකින් නිදහස් වන දහම් මඟේ පිහිටියේ සම්බුදුරජාණන් වහන්සේ 'සවන් දීම' නම් වූ ගුණයේ පිහිටා ඔවුන්ට අනුකම්පාවෙන්, දයා මෙතින් සරණ සැලසූ නිසයි...

ධර්මය පුරුදු පුහුණු කරන කෙනා වුණත් මුලින් ම කරන්න ඕනේ හොඳින් සවන් දෙන එකයි. බොහෝ ධර්ම දේශනා ආරම්භයේ දී අපේ ශාස්තෘන් වහන්සේ ශ්‍රාවකයන්ට මුලින් ම වදාරන්නේ, "තං සුණාථ - මෙය අසන්න" කියලයි. ඉගෙන ගන්නා වයසේ සිටිනා දූලා පුතාලා තමන් පන්ති කාමරයේ ඉද්දිත් මේ ගුණයේ පිහිටන්න ඕන. හොඳින් සවන් දෙන කෙනාට තමයි හොඳින් අර්ථ වැටහෙන්නේ. ධර්මය වැනි මහේශාක්‍ය වූ කාරණාවනටත් එතරම් උපකාරක වන **'සවන් දීම'** එදිනෙද ජීවිත ගෙවද්දි කොහොමටත් උපකාරකයි.

මේ දේ කරන්න හොඳ පුහුණුවකුත් වුවමනයි. අපි

කරන දේවලට, අපි කියන වචනවලට හැමදේකට ම මුල් වෙන්නේ සිත ම යි. කථා කරන්න කලින් සිතා බලන එක කොහොමටත් කෙරෙන දෙයක්. ඒත් අපි ඉන්නේ ඒ ගැන සිහියෙන්වත්, නුවණින්වත් නෙමෙයි. ඒ නිසයි, අපි කථා කරන දේ ඊට කලින් සිතා බලනවා කියන දේ අපට හඳුනාග න්න බැරි. හොඳ සවන් දෙන්නෙක් තුළ සිත ගැන හොඳ අවධානයක් පැවැත්වීමත් ක්‍රමයෙන් පුහුණු කෙරෙනවා. සිත ගැන අවධානයෙන් ඉන්න කෙනා තමයි දුවේ පුතේ යහපත අයහපත, කුසලය අකුසලය වෙන් කොට හඳුනාගන්න දක්ෂ වෙන්නෙත්...! ඒක ධර්ම මාර්ගය දියුණු කරද්දිත් ගොඩාක් ප්‍රයෝජනවත්.

'සවන් දීම' නම් වූ මේ ගුණධර්මය ඔබ තුළ වැඩී යද්දි ඔබ නිතැතින් ම අන් පිරිස අතර ජනප්‍රිය කෙනෙක් බවටත් පත් වෙනවා. එහෙම වෙන්නේ ඇයි දන්නවා ද? සවන් දෙන්නන් ලෝකයේ දුර්ලභ නිසා... එවැනි දුර්ලභ සවන් දෙන්නෙකු මුණගැසීම අන් අයට සුවපහසුව ඇති කරලන නිසා... ඔන්න ජනයාට ප්‍රිය කෙනෙකු වෙන්නත් පහසු ක්‍රමයක්...!

ඒ වගේ ම යි දුවේ පුතේ, ඔබ අන් අයට සවන් දෙද්දී ඔවුන් අසනා දෙයට පිළිතුරු දීම වෙනුවෙන් පමණක් සවන් දෙන්නට එපා. ඒ කෙනා ව තේරුම් ගන්නා අදහසත්, ඒ කෙනා පත්ව සිටින තත්ත්වය තේරුම් ගන්නා අදහසත්, ඒ වචනවලට පිටුපසින් ඇති අර්ථය දැනගන්නා අදහසත් ඔබ තුළ තිබිය යුතුයි. එවිටයි, ඔබ වඩාත් සාවදන සවන් දෙන්නෙක් බවට පත් වන්නේ. එවිට ම තමයි ඔබට සවන් දීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන ලැබිය හැකි වන්නේත්...!

තවත් කාරණයක්...! අප සරණ ගිය සම්බුදුරජාණන් වහන්සේ කළ යුතු දස කථාවන් සහ නොකළ යුතු දෙතිස් කථාවන් වදාරා තිබෙනවා. අකුසල රැස් වෙන දෙතිස් කථාවෙන් වළකින්න තිබෙන්නේ දස කථාවල යෙදීමෙන්. අද සමාජයේ දස කථාවට වඩා බලවත් ව තිබෙන්නේ දෙතිස් කථාව. ඔන්න ඔය කාරණය නිසාත්, කථාව අඩු කරලා වැඩියෙන් සවන් දීම පුරුදු කරන එක ඔබට යහපත පිණිස ම පවතීවි.

රහතන් වහන්සේලා විසින් පසසනු ලැබූ නිහඬ බව පුරුදු පුහුණු කර ගන්නත්, හොඳ සවන් දෙන්නන් වීම තුළින් ඔබගේත් - අන් අයගේත් යහපත උදා කර ගන්නත් ඔබ හැම දෙනාට ම උතුම් තෙරුවනේ ආශීර්වාදය සැලසේවා!

# නිර්මාණ ඉසව්ව

පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව




13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
කාවින්ද්‍යා චමෝදි දියණිය විසින් එවූ නිර්මාණයක්...





විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන
ජනනි අශිංකා දියණිය විසින් එවූ නිර්මාණයක්...



11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
හසින්තා පමුදි දියණිය විසින් එවූ නිර්මාණයක්...




13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
කාවින්ද්‍යා චමෝදි දියණිය විසින් එවූ නිර්මාණයක්...



8 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
රසිඳු ජනිත් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
සහනි වර්ෂා දියණිය විසින් එවූ නිර්මාණයක්...



7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
අමානි චේතනා දියණිය විසින් එවූ නිර්මාණයක්...




11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
කාවින්ද්‍යා සෙව්වන්දි දියණිය විසින් එවූ නිර්මාණයක්...



8 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
රසිඳු ජනිත් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන
ජනිත් ගිම්හාන පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...

# 2022 අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ ප්‍රතිඵල

| නම | විශය ධාරාව | ප්‍රතිඵලය | දිස්ත්‍රික් කුසලතාවය | සමස්ථ ලංකා කුසලතාවය | පාසල | ශිෂ්‍යත්ව අංකය |
|---|---|---|---|---|---|---|
| එච්.ඒ. සුපුනි සන්දීපනී | කලා | A3 | 151 | 2504 | සී.ඩබ්.ඩබ්. කන්නංගර ම.ම.වි. | 2000/712 |
| කේ.කාවින්ද්‍යා මල්සරණි ද සිල්වා | කලා | A3 | 82 | 514 | මහින්ද රාජපක්ෂ විද්‍යාලය | 2000/656 |
| ආර්.ඩී. දසිනි සංජනා | කලා | A3 | 06 | 162 | බ/ උඩවෙල ද්විතියික පාසැල | 2000/641 |
| කේ.වී. නිපුනි තාරුකා මධුවන්ති | කලා | A3 | 118 | | බප/හො/ දියකඩුව විද්‍යාර්ථ ක.වි | 2000/634 |
| ජේ. අමාෂා ලක්ෂිණී | විද්‍යා | A3 | 9 | 142 | ර/ බලංගොඩ ආනන්ද මෛත්‍රී ම.ම.වි. | 2000/660 |
| ඩී.එච්. දිනිඳු රවිහාර | වානිජ | A3 | 807 | 3587 | බෝමිරිය ම.ම.වි. | 2000/716 |
| ආර්. මනුජ අනුහස් විජේමාන්න | වානිජ | A3 | 184 | 3775 | ර/ බලංගොඩ ආනන්ද මෛත්‍රී ම.ම.වි. | 2000/662 |
| කේ. ශානිකා මධුෂානි මුණසිංහ | වානිජ | A3 | 17 | 303 | බප/මතු/ මෝල්කාව ම.වි | 2000/698 |
| චමෝද්‍යා අනුෂානි පතිරගේ | වානිජ | A3 | 315 | 1185 | දේවි බාලිකා විද්‍යාලය | 2000/710 |
| එම්.ඒ. දසුනි කාවිද්‍යා | කලා | A3 | 57 | | බප/මතු/උඩවෙල ශ්‍රී පියරතන ම.වි | 2000/649 |
| කේ.ඒ. පසිඳු මල්ශාන් රාජරත්න | ගණිත | A2 B1 | 38 | 959 | බ/ බණ්ඩාරවෙල මධ්‍ය මහා වි. | 2000/663 |
| කේ. ගෞරි පවිත්‍රා ධර්මරත්න | විද්‍යා | A1 B2 | 239 | 1179 | ධර්මපාල විද්‍යාලය - පන්නිපිටිය. | 2000/666 |
| ඒ.එම්. විසල් විහඟ ඒකනායක | විද්‍යා | A1 B2 | | | ආනන්ද විද්‍යාලය කොළඹ | 2000/711 |
| ජී.කේ.ඩී. මහේෂා හර්ෂණී මධුශානි | තාක්ෂණ | A1 B1 C1 | 21 | 346 | බුලත්සිංහල ජාතික පාසැල | 2000/672 |
| ඉමල්කා ප්‍රභාෂි විජේසිංහ | තාක්ෂණ | B2 C1 | 71 | 738 | ගම්/රත්නාවලී බාලිකා විද්‍යාලය | 2000/839 |
| ආර්.එම්. චන්දිම ලක්මාල් දේශප්‍රිය | විද්‍යා | B1 C2 | 565 | 6969 | කුලි/ මහින්දෝදය ම.වි. | 2000/665 |
| එම්.එච්. ඉසුරි සාගරිකා | තාක්ෂණ | B1 C2 | 75 | 1370 | බප/මතු/ උඩවෙල ශ්‍රී පියරතන ම.වි | 2000/653 |
| එස්.එම්. හසන්ත දිල්ශාන් සේනාධිපති | ගණිත | B1 C2 | 470 | 5816 | කු/ මලියදේව ආදර්ශ ම. විද්‍යාලය | 2000/670 |
| කේ.ඩබ්. විහාරි අංජනා ආරියසේන | විද්‍යා | C3 | 426 | 7893 | ර/ඇඹි කොළොන්න ජාතික පාසැල | 2000/694 |
| ආර්.එම්. හිමාෂා මල්කි රත්නායක | කෘෂිකර්ම | C1 S2 | | | කු/ මලියදේව බා.වි. | 2000/664 |
| ජී. තුෂිත ප්‍රභාෂන් | ගණිත | C1 S2 | | | ගා/ මහින්ද විද්‍යාලය | 2000/652 |

**උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ**
**සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ - අප්පමත්තස්ස යසෝ'භිවඩ්ඪති**

නැඟී සිටින වීරියෙන් යුක්ත නම්,
හොඳින් සිහිය පවත්වනවා නම්, පිරිසිදු ක්‍රියාවෙන් යුක්ත නම්,
නුවණින් විමසා බලා කටයුතු කරනවා නම්,
සංවර නම්, ධාර්මික ජීවිතයක් ගෙවනවා නම්,
අන්න ඒ අප්‍රමාදී පුද්ගලයාගේ
කීර්ති රාවය ඉහළින්ම පැතිරෙනවා.

(වේළුවනාරාමයේ දී කුම්භඝෝෂක අරහයා වදාළ ගාථාවකි)
ධම්ම පදය - අප්පමාද වර්ගය

**ඵන්දනං චපලං චිත්තං - දුරක්ඛං දුන්නිවාරයං**
**උජුං කරෝති මේධාවී - උසුකාරෝ'ව තේජනං**

සිත කියලා කියන්නේ අරමුණක් පාසා
සැලෙන දෙයක්. චපල දෙයක්. රැකගන්නට
අමාරු දෙයක්. වරදින් වළක්වන්ටත් අමාරු දෙයක්.
නමුත් බුද්ධිමත් කෙනා (ධර්මයේ පිහිටලා) එබඳු සිත පවා
ඍජු කරගන්නවා. ඇද කුද හැරලා ඊ දණ්ඩක්
ඍජු කරන හී වඩුවෙක් වගේ.

(වාලිකා පර්වතයේ දී මේඝිය තෙරුන් අරහයා වදාළ ගාථාවකි)
ධම්ම පදය - චිත්ත වර්ගය

©2023 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P. 0112 571 471 | Fax : 0112 548 400 | Web : www.shraddha.lk | Email : edu@shraddha.lk

ShraddhaTV ShraddhaTV ShraddhaTV ShraddhaTV